## දෙවැනි කොටස

## මහා බැංකුවේ ගිණුම් හා කටයුතු


| | පිටුව |
|---|---|
| ගිණුම් හා බැංකු කටයුතු ... ... ... ... | I |
| ව්‍යවහාර මුදල් නිකුතුව ... ... ... | VI |
| බැංකු කටයුතු සංවර්ධනය ... ... ... ... | VI |
| බැංකු පරිපාලන ... ... ... ... | VII |
| සංවර්ධන මුදල් ... ... ... ... | VII |
| ග්‍රාමීය ණය ... ... ... ... | XII |
| සමීක්ෂණ ... ... ... ... | XVI |
| ග්‍රාමීය බැංකු හා මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලය ... ... | XVII |
| ප්‍රකාශන ... ... ... ... | XVII |
| පුහුණු කිරීම් ... ... ... ... | XVIII |
| සම්මන්ත්‍රණ ... ... ... ... | XVIII |
| අනුග්‍රාහක සේවා ... ... ... ... | XIX |
| වැඩ බලමුළුව ... ... ... ... | XIX |
| ප්‍රාදේශීය කාර්යාලය – මාතර ... ... | XIX |
| ප්‍රාදේශීය කාර්යාලය – අනුරාධපුරය ... ... ... | XXII |
| විනිමය පාලන ... ... ... ... | XXV |
| රාජ්‍ය ණය ... ... ... ... | XXVII |
| සේවක අර්ථසාධක අරමුදල ... ... ... | XXVIII |
| කාර්ය මණ්ඩල පුවත් ... ... ... ... | XXX |

# මහ බැංකුවේ ගිණුම් හා කටයුතු

## ගිණුම් හා බැංකු කටයුතු

1983 දෙසැම්බර් 31 වැනි දිනට මහ බැංකුවේ ශේෂ පත්‍රය හා 1983 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ලාභාලාභ ගිණුම 2.1 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

පෙර වර්ෂයේ මට්ටමට වඩා සියය ට 10 ක වැඩිවීමක් පෙන්නුම් කරමින්, 1983 අවසානයේදී මහ බැංකුවේ මුළු වත්කම් / වගකීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 33,096.9 ක්ව පැවතුනි. '' ජාත්‍යන්තර සංචිත '' (සියයට 2) සහ '' දේශීය වත්කම් '' (සියයට 15) වැඩි වීම හේතුකොටගෙන මෙම වත්කම් වැඩි විය. රජය, රාජ්‍ය නියෝජ්‍යත්ව සහ වෙළෙඳ බැංකු තැන්පතු රුපියල් දශ ලක්ෂ 3,288.3 සිට රුපියල් දශ ලක්ෂ 5,226.3 දක්වා ද, ව්‍යවහාර මුදල් සංසරණය රුපියල් දශ ලක්ෂ 6,856.5 සිට රුපියල් දශ ලක්ෂ 8,173.5 දක්වා ද වැඩි වීම නිසා එම කාලය තුළදී බැංකුවේ වගකීම් ද වැඩි විය.

රුපියල් දශ ලක්ෂ 2,954.8 ක් වූ 1983 වර්ෂයේ බැංකුවේ ආදායම පෙර වර්ෂයට වඩා සියයට 8 ක වැඩිවීමක් පෙන්නුම් කළේය. වියදම්, සංචිත ගිණුම් සඳහා වෙන් කිරීම් සහ අගයක්ෂය සඳහා වෙන් කිරීම් කළ පසු මහ බැංකුවේ ශුද්ධ ලාභය රුපියල් දශ ලක්ෂ 1,651.0 ක් විය. මුදල් නීති පනතේ 39 (ආ) වගන්තිය ප්‍රකාර රුපියල් දශ ලක්ෂයක් අතිරික්තයට එක්කරන ලදී. මහ බැංකුවට, ආණ්ඩුව නොපියවා ඇති ණය කොටසක් ඇවර කරනු පිණිස ශේෂ වූ රුපියල් දශ ලක්ෂ 1,650.0 ක මුදල මුදල් නීති පනතේ 39 (ඇ) වගන්තිය ප්‍රකාර ආණ්ඩුවට ගෙවන ලදී.

## විදේශ විනිමය

ශ්‍රී ලංකා රුපියල්වලට සාපේක්ෂව, බැංකුවේ එක්සත් ජනපද ඩොලර් එතැන් මිළදී ගැනීම් හා විකුණුම් අනුපාතිකයන් වැඩ කරන සෑම දිනකම පෙරවරුවෙහි ප්‍රකාශයට පත් කිරීම, මහ බැංකුව විසින් තවදුරටත් කරගෙන යන ලද අතර, මෙම අනුපාතිකයන් අනුව වෙළෙඳ බැංකු සමග පස්වරු 2.30 දක්වා ගණුදෙනු කරනු ලැබීය. රුපියල්වලට සාපේක්ෂව එක්සත් ජනපද ඩොලර් මිළට ගැනීම සම්බන්ධව ශ්‍රී ලංකාවේ වෙළෙඳ බැංකු සමග කරනු ලබන ඉදිරි ගණුදෙනු හය මාසයක උපරිම කාලයක් සඳහා සීමා කිරීම, මහ බැංකුව විසින් තවදුරටත් කරගෙන යනු ලැබීය. ආසියානු නිෂ්කාශන සංගම් ගිවිසුම යටතේ ව්‍යවහාර මුදල් ගණුදෙනුවල වෙනසක් වර්ෂය තුළ සිදු නොවීය. එතැන් සහ හය මාසයක උපරිම කාලයක් සඳහා වූ ඉදිරි විකිණීම් හා මිළදී ගැනීම් යන දෙකම තවදුරටත් ක්‍රියාත්මක කෙරුණි. බංගලදේශ ටාකා, බුරුම ක්‍යාට්, ඉන්දියානු රුපියල්, ඉරාන රියාල්, නේපාල රුපියල් සහ පකිස්තානු රුපියල් යනාදිය උපයෝගී කරගනු ලැබූ ව්‍යවහාර මුදල්ය.

## ආසියානු නිෂ්කාශන සංගමය

පසුගිය වර්ෂයේ රුපියල් දශ ලක්ෂ 4,176.2 ක් වූ ප්‍රමාණය සමග සසඳන කල සමාලෝචිත වර්ෂය තුළ ආසියානු නිෂ්කාශන සංගමය මාර්ගයෙන් කෙරුන ගණුදෙනුවල මුළු වටිනාකම රුපියල් දශ ලක්ෂ 4,618.0 ක් විය. 1982 වර්ෂයේ රුපියල් දශ ලක්ෂ 142.5 ක් වූ ශුද්ධ ලැබීම් සමාලෝචිත වර්ෂයේදී රුපියල් දශ ලක්ෂ 214.5 ක් විය.

**1983 දෙසැම්බර් 31 වැනි දිනට**

**1983 දෙසැම්බර් මස 31 වැනි**

## වගකීම්

| 1982 දෙසැම්බර් 31 වැනිදින රුපියල් | | | 1983 දෙසැම්බර් 31 වැනි දින රුපියල් | |
|---|---|---|---|---|
| | | **ප්‍රාග්ධන ගිණුම්** | | |
| 1,50,00,000 | | ප්‍රාග්ධනය .. | 1,50,00,000 | |
| 6,70,00,000 | 8,20,00,000 | අතිරික්තය .. | 6,80,00,000 | 8,30,00,000 |
| | | **සංසරණයෙහි පවත්නා ව්‍යවහාර මුදල්** | | |
| 659,46,11,997 | | නෝට්ටු .. | 785,91,48,039 | |
| 26,18,70,269 | 685,64,82,266 | කාසි .. | 31,43,97,956 | 817,35,45,995 |
| | | **තැන්පතු** | | |
| 102,58,96,298 | | රජය .. | 175,81,89,021 | |
| 1,88,04,278 | | රාජ්‍ය නියෝජ්‍යත්ව හා ආයතන .. | 5,48,45,058 | |
| 224,35,75,525 | | වෙළෙඳ බැංකු .. | 341,32,45,644 | |
| 511,34,96,976 | | ජාත්‍යන්තර සංවිධාන, විදේශීය රාජ්‍ය හා විදේශීය බැංකු ආයතන .. | 489,41,95,284 | |
| | | භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කළ රු. 12,20,74,500 හැර | | |
| 4,06,865 | | අනිවාර්ය ඉතිරිකිරීමේ අරමුදල .. | 1,86,510 | |
| 56,11,58,942 | 896,33,38,884 | අනෙකුත් .. | 59,96,84,518 | 1,072,03,46,035 |
| | 185,11,77,070 | විදේශීය ණය ගැනීම් .. | | 187,30,56,859 |
| | 77,50,00,000 | මධ්‍යම හා දිගුකාලීන ණය අරමුදල .. | | 77,50,00,000 |
| | 11,00,00,000 | ප්‍රාග්ධන දායක දීමනා ගිණුම .. | | 11,00,00,000 |
| | 1,152,87,47,416 | අනෙකුත් වගකීම් හා ගිණුම් .. | | 1,136,19,57,704 |
| | 3,016,67,45,636 | | | 3,309,69,06,593 |

**1983 දෙසැම්බර් මස 31 වැනි දිනෙන්**

| 1982 දෙසැම්බර් මස 31 දින රුපියල් | | | 1983 දෙසැම්බර් මස 31 දින රුපියල් |
|---|---|---|---|
| | 122,13,89,163 | සාමාන්‍ය වියදම් (වැටුප්, මුදල් නෝට්ටු හා කාසි සඳහා වියදම් හා බැංකු ගොඩනැගිලි හා කාර්යාල උපකරණ සඳහා ක්ෂයවීම් ඇතුළුව) සහ මුදල් නීති පනතේ 38 වැනි වගන්තිය ප්‍රකාර ඉන්පසුව කරන ලද වෙන් කිරීම් .. | 130,37,66,732 |
| | | 1983 දෙසැම්බර් 31 වැනිදායින් අවසන්වූ වර්ෂයේ ශුද්ධ ලාභය | |
| 14,50,140 | | මූල්‍ය ගැලපීම් ගිණුමට – මුදල් නීති පණතේ 39 (අ) වගන්තිය ප්‍රකාර ශේෂය පියවීමට රු. 58,642 | |
| 10,00,000 | | මුදල් නීති පණතේ 39 (ආ) වගන්තිය ප්‍රකාර අතිරික්තයක් වශයෙන් යොදා ගන්නා ලදී. රු. 10,00,000 | |
| 150,00,00,000 | 150,24.50,140 | මුදල් නීති පණතේ 39 (ඇ) වගන්තිය ප්‍රකාර රජයට ශ්‍රී ලංකා මහ බැංකුව වෙත නොපියවා ඇති වගකීම් කොටසක් පියවීමට රු. 165,00,00,000 | 165,10,58,642 |
| | 272,38,39,303 | | 295,48,25,374 |

**වර්ණසේන රාසපුත්‍ර**
අධිපති.

**යු. ඒ. ද සිල්වා**
ප්‍රධාන ගණකාධිකාරී.

## ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම්

## දිනට ශේෂ පත්‍රය

| 1982 දෙසැම්බර් 31 වැනි දින රුපියල් | | වත්කම් | 1983 දෙසැම්බර් 31 වැනි දින රුපියල් | |
|---|---|---|---|---|
| | | **ජාත්‍යන්තර සංචිතය** | | |
| 621,94,83,080 | | පිටරට තිබෙන මුදල් හා බැංකු ශේෂයන් .. | 600,39,52,062 | |
| 72,84,36,348 | | *විදේශීය සුරැකුම්පත් .. | 122,25,99,773 | |
| 14,80,29,819 | 709,59,49,247 | විශේෂ ආපසුගැනීම් හිමිකම්පත් | 2,04,37,101 | 724,69,88,936 |
| | | **දේශීය වත්කම්** | | |
| | | ණය සහ අත්තිකාරම් | | |
| 214,03,37,811 | | රජයට .. | 279,44,61,262 | |
| | | අනෙකුත් අයට– මධ්‍යම හා | | |
| 60,32,13,207 | | දීර්ඝකාලීන .. | 62,34,91,947 | |
| 79,29,53,480 | | කෙටිකාලීන .. | 232,11,22,015 | |
| 1,586,01,39,246 | | රජයේ සහ රජය සහතික කළ සුරැකුම්පත් .. | 1,659,85,92,278 | |
| 11,00,00,000 | 1,950,66,43,744 | මූල්‍ය සහ අනෙකුත් ආයතනවලට දායක දීමනා .. | 11,00,00,000 | 2,244,76,67,502 |
| | 356,41,52,645 | අනෙකුත් වත්කම් හා ගිණුම් .. | | 340,22,50,155 |
| | | *1964 පෙබරවාරි මස 01 දින රු. 55,27,675 ප්‍රකාශිත වටිනාකමට හා 1965 මැයි මස 24 වැනි දින රු. 75,450 ප්‍රකාශිත වටිනාකමට රජයේ ආයතනවලින් ලබාගත් සුරැකුම්පත් ඇතුළත් වෙයි. (ඒ දිනවල මෙකී සුරැකුම්පත්වල ඇස්තමේන්තු කළ වෙළඳ වටිනාකම පිළිවෙලින් රු. 29,33,697 ක් සහ රු.. 34,340 ක් විය. | | |
| | 3,016,67,45,636 | | | 3,309,69,06,593 |

## අවසන් වූ වර්ෂයේ ලාභාලාභ ගිණුම

| 1982 දෙසැම්බර් මස 31 දින රුපියල් | | | 1983 දෙසැම්බර් මස 31 දින රුපියල් | |
|---|---|---|---|---|
| | 272,38,39,303 | පොළී ආදිය .. | | 295,48,25,374 |
| | 272,38,39,303 | | | 295,48,25,374 |

1983 දෙසැම්බර් 31 වැනි දිනට අවසන් වර්ෂය සඳහා වූ ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) වගන්තිය සමග කියවන ලද 1971 අංක 38 දරණ මුදල් නීති පනතේ 13 (1) වගන්තිය සහ මුදල් නීති පනතේ (පරි. 422) 42 (1) වගන්තිය අනුව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

මුදල් නීති පනතේ (පරි. 422) 42 (2) වගන්තිය ප්‍රකාර මුදල් ඇමතිතුමා වෙත ඉදිරිපත් කළයුතු මාගේ වාර්තාව යථා කාලයේදී ඉදිරිපත් කෙරේ.

ඩබ්ලිව්. ජී. ඇපා
විගණකාධිපති.

1984 අප්‍රේල් 4 වැනි දින,
කොළඹ 7,
විගණක කාර්යාලයේදී ය.

**පෙරළා සිය රට යන ඉන්දියානුවන් වෙත ආධාරක හා කරුණා සහගත ගෙවීම්**

1964 ඉන්දු -- ලංකා ගිවිසුම මගින් ආවරණය ලද ඉන්දියානු සම්භවය ඇති වතු කම්කරුවන් පෙරළා සිය රට යැවීම ඉක්මන් කරවනු පිණිස, රජය වෙනුවෙන් ක්‍රම දෙකක් ක්‍රියාත්මක කරවීම තවදුරටත් කරගෙන යනු ලැබීය. මේවා නම් :--

(1) පෙරළා සිය රට යන්නන්හට ප්‍රේෂණය කිරීමට බලය දෙන ලද ප්‍රමාණයෙන් සියයට 65 කට සමාන මුදලක් හෝ ඉන් කොටසක් ආධාර වශයෙන් ගෙවීම ; සහ

(2) මෙම කම්කරුවන්ට දිවයින හැර යාම සඳහා දිරිගැන්වීමක් වශයෙන් කරුණා සහගත ගෙවීමක් ලෙස රුපියල් 500 ක් හා එම මුදලින් සියයට 65 ක් ගෙවීමත් ය.

බැංකුව විසින් මෙකී ක්‍රම දෙක වෙළෙඳ බැංකු මගින් ක්‍රියාත්මක කරන ලදී.

**ණය සහ අත්තිකාරම්**

1983 මාර්තු 24 වැනි දින සිට රජයේ සහ රජය සහතික කළ සුරැකුම්පත් හා වාණිජ හ නිෂ්පාදන ණයට අදාළ භාවිතීය පොරොන්දු නෝට්ටු මත වෙළෙඳ බැංකුවලට දෙනු ලබන කෙටි කාලීන අත්තිකාරම් සඳහා වන මහ බැංකු පොළී අනුපාතිකය (බැංකු අනුපාතිකය) වර්ෂයකට සියයට 14 සිට 13 දක්වා අඩු කරන ලදී. වෙළෙඳ බැංකු විසින් ස්වකීය ගණුදෙනු කරුවන්ට දෙනු ලබන ප්‍රතිමූල්‍ය අත්තිකාරම් සඳහා වූ පොළී අනුපාතිකය වර්ෂයකට සියයට 13 ට වඩා වැඩි නොවන කොන්දේසිය මත, 1983 මාර්තු 24 වැනි දින සිට ශ්‍රී ලංකාවේ අපනයන මූල්‍යකරණය පිණිස බැංකුවලට සහායවීම සඳහා මහ බැංකුව විසින් වෙළෙඳ බැංකුවලට දෙනු ලබන කෙටි කාලීන ප්‍රතිමූල්‍ය ණය සඳහා වන පොළී අනුපාතිකය වර්ෂයකට සියයට 12 සිට සියයට 11 දක්වා අඩු කරන ලද අතර, නැවතත් 1983 ජුනි 1 වැනි දින සිට වර්ෂයකට සියයට 10 දක්වා අඩු කරන ලදී. මධ්‍ය හා දිගු කාලීන ණය ක්‍රමය යටතේ දෙනු ලබන ප්‍රතිමූල්‍ය ණය සඳහා අදාළ පොළී අනුපාතිකයන්, 1983 මාර්තු 24 වැනි දින සිට වර්ෂයකට සියයට 1 කින් අඩු කෙරුණි. කෙටි කාලීන පොළී අනුපාතිකයන් අඩු කිරීමත් සමගම, මහ බැංකුව කෙටිකාලීන අත්තිකාරම් සඳහා වූ දණ්ඩන අනුපාතිකයන් වර්ෂයකට සියයට 21 සිට 30 දක්වා අන්තරයක සිට වර්ෂයකට සියයට 20 ක සමතලයකට 1983 මාර්තු 30 වැනි දින සිට අඩු කරන ලදී. කෙසේ වුවද, දණ්ඩන අනුපාතික ණය ගැනීම් 1983 නොවැම්බර් 23 වැනි දින සිට අත්හිටවනු ලැබීය.

මහ බැංකුව විසින් බැංකු අනුපාතිකයට අනුව වෙළෙඳ බැංකු වෙත ලබා දෙනු ලබන ප්‍රතියෝජන සහ අපනයන සඳහා වන ප්‍රතිමූල්‍ය ක්‍රමය, වර්ෂය තුළදී තවදුරටත් ක්‍රියාත්මක කෙරුණි. තවද, වෙළෙඳ බැංකුවලට අනුග්‍රාහක අනුපාතිකයන් අනුව සම්ප්‍රදායික නොවන භාණ්ඩ අපනයනකරුවන් වෙත මූල්‍ය පහසුකම් සැපයීම සඳහා බැංකුව, 1983 මාර්තු 16 වැනි දින සිට විවෘත අතිරේක අපනයන ණය ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. මෙම ක්‍රමය යටතේ වර්ෂ-යකට සියයට 7 ක වට්ටමක් මත, උපරිම දින 120 ට සකස් කරන ලද භාවිතීය පොරොන්දු නෝට්ටු වට්ටම් කිරීම සඳහා ඉල්ලුම්පත් මහ බැංකුව, වෙළෙඳ බැංකුවලින් බාර ගනු ලබන්නේ වෙළෙඳ බැංකු ස්වකීය ගණුදෙනුකරුවන්ට දෙනු ලබන අත්තිකාරම්, වට්ටම් මත වර්ෂයකට සියයට 9.75 ක් හෝ මුළු මුහුණත අගය දීමේදී වර්ෂයකට සියයට 10.80 ක් හෝ නොඉක්මවන කොන්දේසිය මතය.

වී, එළවළු හා අනෙකුත් නියමිත භෝග නිෂ්පාදනය සඳහා සමුපකාර සමිතිවල හෝ පුද්ගල-යින්ගේ භාවිතීය පොරොන්දු නෝට්ටු මත වෙළෙඳ බැංකුවලට දෙනු ලබන මහ බැංකු අත්තිකාරම් සඳහා වූ පොළී අනුපාතිකය තවදුරටත් වර්ෂයකට සියයට 1.5 ක්ව පැවතුණි. සමුපකාර සමිතිවලට, කෘෂි සේවා මධ්‍යස්ථානවලට සහ බලය ලත් පුද්ගලයන්හට වී මිළට

ගැනීම සහ ප්‍රාදේශිකව වගා කරනු ලබන වෙනත් භෝග මිළ දී ගැනීම හා ගබඩා කිරීම මූල්‍ය-කරණය සඳහා භාවිතීය පොරොන්දු නෝට්ටු මත වෙළෙඳ බැංකුවලට දෙනු ලබන අත්තිකාරම් සඳහා වූ මහ බැංකු පොළී අනුපාතිකය වර්ෂයකට සියයට 3 ක් සේ නොවෙනස්ව පැවතියේය.

**මධ්‍ය හා දිගු කාලීන ණය අරමුදල**

1983 වර්ෂය තුළදී මහ බැංකුව, මධ්‍ය හා දිගු කාලීන ණය අරමුදල යටතේ ප්‍රතිමූල්‍ය පහසුකම් සැපයීමේ ක්‍රමය තවදුරටත් ක්‍රියාත්මක කරන ලදී. 1983 දී ලබා දෙන ලද මුළු ප්‍රති-මූල්‍ය ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 156.1 ක් විය.

**වෙළෙඳ බැංකු ණය**

1983 නොවැම්බර් 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි 1983 නොවැම්බර් 1 වැනි දිනට හෝ ඉන්පසුව පෞද්ගලික අංශයට ලබා දී නොපියවා ඇති මුළු අත්තිකාරම් ප්‍රමාණය 1983 ඔක්තෝබර් 31 වැනි දින දක්වා ලබා දී ඇති සහ නොපියවා ඇති මුළු අත්තිකාරම් ප්‍රමාණය නොඉක්මවන බවට වග බලාගන්නා ලෙසත්, සමහර අංශ ණය දීමේදී ප්‍රමුඛත්වයෙහි ලා සලකන ලෙසත් සියළුම වෙළෙඳ බැංකුවලට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විධාන කරන ලදී. මෙම විධානය 1983 දෙසැම්බර් 1 වැනි දින සිට අවලංගු කරන ලදී.

**සංචිත නියමයන්**

1983 දෙසැම්බර් 2 වැනි දින සිට මහ බැංකුවේ සංචිත නියමයන් සංශෝධනය කරන ලදී. ඉල්ලුම් තැන්පතු සඳහා වූ ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය සියයට 14 සිට සියයට 16 දක්වා වැඩි කරන ලද අතර, කාලීන හා ඉතිරි කිරීමේ තැන්පතු සඳහා අනුපාතය සියයට 6 සිට සියයට 8 දක්වා වැඩි කෙරුණි.

1983 දෙසැම්බර් 16 වැනි දින සිට මීට අමතරව වෙළෙඳ බැංකු විසින් අනුමත කරන ලදුව, එහෙත් ප්‍රයෝජනයට නොගත් මුළු අයිරා ශේෂයෙන් සියයට 16 ක ප්‍රමාණයක් සංචිත නියම-යන් ලෙස පවත්වා ගත යුතු බවට එම බැංකුවලට විධාන කරන ලදී.

**භාණ්ඩාගාර බිල්පත්**

මහ බැංකුව, සිය භාණ්ඩාගාර බිල්පත් පිළිබඳ ගණුදෙනු තවදුරටත් විවට වෙළෙඳ කටයුතු යටතේ කරගෙන යනු ලැබීය. බැංකුව තම භාණ්ඩාගාර බිල්පත් විකුණා විවිධ කල්පිරීම් සහිත භාණ්ඩාගාර බිල්පත් මිළයට ගනී. 1982 රුපියල් දශ ලක්ෂ 48,701.9 සිට 1983 රුපියල් දශ ලක්ෂ 18,946.9 දක්වා භාණ්ඩාගාර බිල්පත් මුළු විකිණීම්වල අඩුවීමක් විය. මිළට ගැනීම්ද 1982 රුපියල් දශ ලක්ෂ 19,110.2 සිට 1983 රුපියල් දශ ලක්ෂ 12,668.8 දක්වා අඩු විය. 1982 හා සසඳනවිට 1983 දී ඒක්ෂණ මුදල් අනුපාතිකය ඉහළ යාම මෙම ක්‍රමය යටතේ කෙරුණ කටයුතු පහත බැසීමට හේතු වී යයි සැළකේ. වර්ෂය තුළ භාණ්ඩාගාර බිල්පත්වල විවට වෙළෙඳ කටයුතුවලට අදාළ වට්ටම් අනුපාතික වර්ෂයකට සියයට 12 හා 13.75 අතර පැවතුණි.

**අනිවාර්ය ඉතිරිකිරීමේ අරමුදල**

1971 අංක 6 දරණ අනිවාර්ය ඉතිරි කිරීමේ පනත හා 1972 අංක 15 දරණ ආදායම් සීමා කිරීමේ සහ අනිවාර්ය ඉතිරි කිරීමේ නීතිය යටතේ එකතු කරන ලද මුදල්වල භාරකරු වශයෙන් තවදුරටත් ක්‍රියා කළ මහ බැංකුව, රජය වෙනුවෙන් අනිවාර්ය ඉතිරිකිරීමේ අරමුදල පරිපාලනය කළේය. වර්ෂය තුළදී බැංකුව විසින් ප්‍රතිලාභ ආපසු ගෙවීමේ ඉල්ලුම්පත් 1,443 ක් මත රුපියල් දශ ලක්ෂ 6.4 ක් (පොළියද ඇතුළුව) දායකයින්ට ගෙවන ලදී.

**රජයේ ගිණුම්**

මහ බැංකුවේ රාජ්‍ය ගිණුම් ශාඛාව රජයේ බැංකුකරු වශයෙන් රාජ්‍ය දෙපාර්තමේන්තුවල, රාජ්‍ය නියෝජ්‍යත්ව හා ආයතනවල සහ සමහර ව්‍යවස්ථාපිත මණ්ඩලවල ගිණුම් තව දුරටත් පවත්වාගෙන යනු ලැබීය. 1983 දෙසැම්බර් අවසානයේදී රාජ්‍ය ගිණුම් අංශයෙහි වූ සක්‍රිය ගිණුම් සංඛ්‍යාව 154 කි (රාජ්‍ය දෙපාර්තමේන්තු 139 ක් හා වෙනත් 15).

ව්‍යවහාර මුදල් නිකුතුව

1983 දෙසැම්බර් 31 වැනි දිනට මුළු ව්‍යවහාර මුදල් සංසරණය රුපියල් දශ ලක්ෂ 8.173 .5ක් විය. මෙය ඊට පෙර වර්ෂයට වඩා රුපියල් දශ ලක්ෂ 1,317.0 ක වැඩි වීමකි. පසුගිය වර්ෂයට වඩා 1983 දී මුදල් නෝට්ටු සංසරණය රුපියල් දශ ලක්ෂ 1,264.5 කින් වැඩි වූ අතර, කාසි සංසරණය රුපියල් දශ ලක්ෂ 52.5 කින් වැඩි විය. සමාලෝචිත වර්ෂය තුළදී රුපියල් 1,000 සහ රුපියල් 500 මුදල් නෝට්ටු සඳහා වූ ඉල්ලුම සැළකිය යුතු අන්දමින් වැඩි විය. 1983 දෙසැම්බර් මාසය අවසානයේදී රුපියල් 500 සහ රුපියල් 1,000 වටිනාකමින් යුත් මුදල් නෝට්ටු වර්ගවල සංසරණය පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 1,533.5 ක් හා රුපියල් දශ ලක්ෂ 2,011.5 ක් විය. මෙම දෙවර්ගයේ සංසරණය වැඩි වීමේ ප්‍රතිඵලයක් වශයෙන් රුපියල් 100 වටිනාකමින් යුත් මුදල් නෝට්ටුවල සංසරණය පෙර වර්ෂයට වඩා රුපියල් දශ ලක්ෂ 297.5 කින් අඩු විය.

රුපියල් 2 සහ රුපියල් 5 වටිනාකමින් යුත් නෝට්ටු වෙනුවට එම වටිනාකමින් යුත් කාසි ලඟදීම නිකුත් කිරීම සඳහා කටයුතු කරගෙන යනු ලැබේ.

බැංකු කටයුතු සංවර්ධනය

සමාලෝචිත වර්ෂය තුළදී වාණිජ බැංකු ක්ෂේත්‍රය තවදුරටත් වර්ධනය විය. දේශීය බැංකුවල ශාඛා මඩුල්ල 16 කින් වැඩි විය. (ලංකා බැංකුව–11, මහජන බැංකුව–3, සීමාසහිත ලංකා වාණිජ බැංකුව–1, සීමාසහිත හැටන් නැෂනල් බැංකුව–1). ලංකා බැංකුවේ කෘෂි සේවා මධ්‍යස්ථානද ඇතුළුව වාණිජ බැංකුවල දේශීය ශාඛා මඩුල්ල 1983 අවසානයේදී ශාඛා 679 කින් සමන්විත විය.

එක්සත් රාජධානියේ වණික් බැංකු කටයුතු පිළිබඳ ආයතනයක් වන 'සීමාසහිත ගිනස් මැහෝන් සහ සමාගමේ' අනුග්‍රහය ඇතුව 'සීමාසහිත මහජන වණික් බැංකුව' නමින් වණික් බැංකු කටයුතු සමාගමක් වර්ෂය තුළදී මහජන බැංකුව විසින් පිහිටුවන ලදී. මෙම ආයතනය පිහිටුවීම වූ කලී පසුගිය අවුරුදු කිහිපය තුළ බැංකු කටයුතු, මූල්‍ය හා ව්‍යාපාර කටයුතුවල වූ ප්‍රසාරණයේ ප්‍රතිඵලයක් වශයෙන් හුදු වාණිජ බැංකු කටයුතුවලට අනුයාත මූල්‍ය සේවාවල අවශ්‍යතාවය පිළිගැනීමකි.

විදේශීය බැංකු සහ අනෙකුත් මූල්‍යායතන ශ්‍රී ලංකාවේ බැංකු කටයුතු වල නියැලීමේ අවස්ථාවන් ලබා ගැනීමට තවදුරටත් උනන්දුවක් දැක්වූහ. වර්ෂය තුළදී නව විදේශ බැංකු ශාඛා කිසිවක් ශ්‍රී ලංකාවේ ආරම්භ නොකළ අතර, ඇමෙරිකා එක්සත් ජනපදයේ චේස් මැන් හැටන් බැංකුවට එහි ශාඛාවක් කොළඹ විවෘත කිරීමට අනුමැතිය දෙනු ලැබීය. මහ කොළඹ ආර්ථික කොමිසමේ ආයෝජන ප්‍රවර්ධන කලාපය තුළ ශාඛාවක් විවෘත කිරීමට මෙන්ම, විදේශ ව්‍යවහාර මුදල්, මුදල් කිරීමේ හා හුවමාරු කිරීමේ කවුන්ටරයක් කටුනායක පිහිටි කොළඹ ජාත්‍යන්තර ගුවන් තොටුපලේ පිහිටුවා ගැනීමට ද සීමාසහිත බැන්ක් ඔෆ් ක්‍රෙඩිට් ඇන්ඩ් කොමර්ස් ඉන්ටර්නැෂනල් (ඕවර්සීස්) බැංකුවට අවසර දෙනු ලැබීය. විදේශ ව්‍යවහාර මුදල් කවුන්ටරයේ කටයුතු 1983 දෙසැම්බර් මාසයේදී ආරම්භ කරන ලදී.

1983 අවසානය වන විට ශ්‍රී ලංකාවේ වූ ශාඛා සහිත විදේශ නිත්‍යවාසී බැංකු සංඛ්‍යාව 21 ක් විය. ඉන් 14 ක් 1977 ට පසු ආරම්භ කරන ලද ඒවාය. මේ අනුව, 1983 අවසානයේ දී දේශීය බැංකු 4 කුත්, විදේශීය බැංකු 21 කුත් ඇතුළුව බැංකු 25 ක් ශ්‍රී ලංකාවේ ක්‍රියාකාරී විය. විදේශීය බැංකුවල නියෝජිත කාර්යාල 2 ක්ද, වණික් බැංකු සමාගම් 2 ක්ද, ('සීමාසහිත ශ්‍රී ලංකා වණික් බැංකුව' නමින් වණික් බැංකුවක්, ලංකා බැංකුව විසින් 1982 දී ආරම්භ කරන ලදුව) රටෙහි ක්‍රියාකාරී විය. 1981 මාර්තු 17 වැනි දින පවත්වන ලද ජනගහණ ජනලේඛනය පදනම් කොට ගණනය කළ විට 1983 දෙසැම්බර් 31 වැනි දිනට එක් බැංකු ශාඛාවකට (ආසන්න වශයෙන්) 21,870 ක ජනගහණයක් විය.

රට පුරා සැහෙන බැංකු ශාඛා මඩුල්ලක් පිහිටුවා ඇති නමුදු, ග්‍රාමීය ක්ෂේත්‍රයට අවශ්‍ය තරම් සේවා ලැබී නැත. මේ නිසා අවශ්‍යතා ඇති කොටස් වලට ණය ලබා දීම පුළුල් කිරීම සහ එක් එක් ක්ෂේත්‍රයේ ඇති උවමනාකම් අනුව, අවශ්‍යතාවය පදනම් කොට ගත් ශාඛා වැඩි කිරීමේ වැඩ පිළිවෙලක් කරා, මහ බැංකුව, බැංකු සංවර්ධන සැලැස්මක් සකස් කර ඇත.

**බැංකු පරිපාලන**

මුදල් නීති පනතේ 29 (1) වගන්තිය යටතේ, 1983 වර්ෂය තුළ වාණිජ බැංකු දහනවයක පරීක්ෂණ කටයුතු අවසන් කරන ලද අතර, 1982–1983 පරීක්ෂණ කාලය තුළ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මකව තිබූ සෑම වාණිජ බැංකුවකම පරීක්ෂණ මේ අනුව අවසන් කරන ලදී.

1979 අංක 27 දරන මුදල් සමාගම් පාලන පනතේ විධිවිධානයන්ට අනුව, මුදල් මණ්ඩලය වෙත ලියාපදිංචි වූ මුදල් සමාගම් අධීක්ෂණය කිරීම සහ පරීක්ෂණය කිරීමෙහි 1983 වර්ෂයේදී තවදුරටත් නිරත විය. පනතේ 15(1) වගන්තිය යටතේ මුදල් සමාගම් අටක පරීක්ෂණ කටයුතු 1983 වර්ෂය තුළ ආරම්භ කරන ලද අතර, එයින් තුනක පරීක්ෂණ කටයුතු අවසන් කරනු ලැබිය. 1982 වර්ෂයේදී පරීක්ෂණ කටයුතු ආරම්භ කළ මුදල් සමාගම් හතරක පරීක්ෂණ කටයුතුද වර්ෂය තුළදී අවසන් කරන ලදී. පනත යටතේ ලියාපදිංචිවීම සඳහා මුදල් සමාගම් විසින් එවන ලද ඉල්ලුම්පත් අගැයීම කොට එක් සමාගමක් වර්ෂය තුළදී මුදල් මණ්ඩලය වෙත ලියාපදිංචි කරන ලදී.

විදේශ ව්‍යවහාර මුදල් බැංකු ක්‍රමය යටතේ වාණිජ බැංකු විසින් ස්ථාපනය කරන ලද විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක මගින් කරනු ලබන ගණුදෙනු පිළිබඳව විමසිලිමත්ව සිටීමේ වැඩ පිළිවෙල දිගටම ක්‍රියාත්මක විය.

**සංවර්ධන මුදල්**

මහ බැංකුවෙන් මධ්‍ය හා දිගුකාලීන ප්‍රතිමූල්‍ය ණය ලබා ගැනීම සඳහා ඉල්ලුම 1983 දීද පහත් මට්ටමක පැවතිණි. බැංකු ක්‍රමය තුළ අධික ද්‍රවශීලතාවයක් පැවතීම, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ණය ප්‍රතිමූල්‍ය ලබා ගැනීම සඳහා ජාතික සංවර්ධන බැංකුව වෙත යොමු කරවීම, අපනයන නැඹුරුවක් සහිත ව්‍යාපෘතීන් සඳහා දෙනු ලබන ප්‍රතිමූල්‍ය පහසුකම් ප්‍රමාණය අඩු කිරීම, ආයෝජන කටයුතු අඩු වීම, හෝටල් ව්‍යාපෘතීන් සඳහා ප්‍රතිමූල්‍ය පහසුකම් සැලසීම අත්හිටුවීම යන කරුණු ප්‍රතිමූල්‍ය ඉල්ලුම පහත හෙලීමට දායක විය.

1983 මාර්තු මාසයේදී, මූල්‍ය ප්‍රතිපත්තියේ ලිහිල් කිරීමක් හේතුකොටගෙන මධ්‍ය හා දිගුකාලීන ණය අරමුදල යටතේ ඇති සියළු කාණ්ඩවලට අයත් ණය සඳහා අදළ වන ප්‍රතිමූල්‍ය පොළී අනුපාතිකයන් සියයට 1 කින් පහත හෙලන ලදී. එසේම III වැනි සහ IV වැනි කාණ්ඩ යටතේ බැංකුවලට දී ඇති පොළී පරතරයද වර්ෂයකට සියයට 5 සිට 4 දක්වා අඩු කරන ලදී. අපනයන නැඹුරුවක් සහිත ව්‍යාපෘතීන් සඳහා (II වැනි කාණ්ඩය යටතේ) දෙනු ලබන ප්‍රතිමූල්‍යද 1983 අප්‍රේල් මස 20 වැනි දින සිට කාලීන ණය මුදලෙන් සියයට 100 සිට සියයට 70 දක්වා අඩු කරන ලදී. මහ බැංකුවේ ප්‍රතිමූල්‍ය පොළී අනුපාතිකයන්, එවන් කටයුතු සඳහා සංවර්ධන බැංකු මගින් අය කරනු ලබන පොළී අනුපාතිකයන් සමග ගැලපෙන සේ සකස් කිරීමට මෙකී වෙනස් කිරීම් උපකාරී විය.

1983 දී, ජාතික සංවර්ධන බැංකුව විසින් ප්‍රතිමූල්‍ය පහසුකම් සලසන සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ණය ක්‍රමය යටතේ ණය සහතික නිකුත් කිරීම පහත් මට්ටමක පැවතුණි. සුමක I ක්‍රමය යටතේ 47 ක්ද, සුමක II ක්‍රමය යටතේ 46 ක්ද වශයෙන් බැංකු වලින් ණය සහතික සඳහා අයදුම්පත් 93 ක් ලැබුණ අතර මෙකී ක්‍රම දෙක යටතේම කලින් වර්ෂයේදී ලැබුණු අයදුම්පත් සංඛ්‍යාව 260 ක් විය. සුමක I යටතේ ක්‍රියාවලිය හීන වූයේ, ජාතික සංවර්ධන බැංකුව විසින් ජාත්‍යන්තර සංවර්ධන සංගමයේ ණය මුදල සම්පූර්ණයෙන් ප්‍රයෝජනයට ගැනීමේ ප්‍රතිඵලයක් වශයෙනි. ජාත්‍යන්තර සංවර්ධන සංගමයේ ණය මාලාවක් මගින්ම

මූල්‍යනය කෙරෙන සුමක II ක්‍රමය සඳහා ප්‍රතිචාරය අඩු වූයේ හැකියාවක් ඇති ව්‍යවසායකයන් අතර උනන්දුව හීන වීම හා බැංකු ක්‍රමය තුළ ද්‍රවශීලතාවය අධික වීම හේතුකොටගෙනය. 1983 මුල් කොටසේදී සුමක II ණය දීම් අනුපාතිකය වර්ෂයකට සියයට 20 ක් ලෙස නොවෙනස්ව පැවතුණි. සුමක I ණය දීම් අනුපාතිකය වර්ෂයකට සියයට 15 ක්ව පැවතිණි. 1983 අග භාගයේදී මීට පිළියමක් වශයෙන් සුමක II යටතේ ණය දීම් අනුපාතිකය සියයට 14 දක්වා පහත හෙලන ලදී.

ප්‍රතිමූල්‍ය ණය මුදල් මෙන්ම බැංකුව මගින් සහතික කැරෙන ණය මුදල්ද සම්බන්ධයෙන් වන පසු-විපරම් කටයුතු 1983 දී තීව්‍ර කෙරිණි. බැංකුව විසින් 1979 ත් 1982 ත් අතර ප්‍රති මූල්‍යනය කරන ලද ව්‍යාපෘතීන්හි ක්‍රියාකාරීත්වය පිළිබඳව සමීක්ෂණයක් පසු-විපරම් අංශය විසින් කරන ලදී. තවද, බැංකුව විසින් සහතික කරන ලද සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ණය සම්බන්ධයෙන් මුහුණ පෑමට සිදු වූ ප්‍රශ්න පිළිබඳව තක්සේරුවක් කරනු පිණිස කොළඹ, ගම්පහ, මහනුවර, මඩකලපුව, හම්බන්තොට, බදුල්ල හා පොළොන්නරුව යන දිස්ත්‍රික්කයන්හි පිහිටි ව්‍යාපෘතීන් 227 ක් ඍජු පරීක්ෂණයන්ට භාජනය කරන ලදී. තාක්ෂණික, අලෙවි හා මූල්‍ය ප්‍රශ්න හේතුකොටගෙන ව්‍යාපෘතීන් දුර්වල වී ඇති බව පරීක්ෂණයන්ගෙන් හෙළි විය. දුර්වල ව්‍යාපෘතීන් පුනරුත්ථාපනය කිරීම සඳහා බැංකුවලට සහාය වීම පිණිස කටයුතු කරගෙන යනු ලැබේ.

1983 දී මහ බැංකුව විසින් නිකුත් කැරුන ණය සහතික ගණන 2,537 දක්වා වැඩි වූ අතර රුපියල් දශ ලක්ෂ 122 ක වගකීමක් සහිත ණය සහතික 1,834 ක් ඉතිරිව තිබුණි. ණය මුදල් 966 ක් හිඟ හිට ඇති බව සහභාගිවූ බැංකු විසින් වාර්තා කර ඇත. මේ හේතුවෙන් 1983 දී ණය පරිපාලන, පසු-විපරම් හා පුනරුත්ථාපන කටයුතු සඳහා දැඩි අවධාරනයක් යොමු කරන ලදී. 1983 දී පිහිටුවන ලද පසු-විපරම් අංශය මගින් ක්ෂේත්‍ර පරීක්ෂණ 227 ක් පවත්වන ලදී. 1983 අග භාගයේදී ව්‍යවසායක සංවර්ධන අංශයක්ද පිහිටුවන ලදී.

**මධ්‍ය හා දිගුකාලීන ණය අරමුදලේ කටයුතු**

මුදල් නීති පනතේ අංක 88 ඒ වගන්තියට අනුව ණය දෙන ආයතන විසින් නිෂ්පාදන කටයුතු සඳහා දෙනු ලබන ණය මුදල් මධ්‍ය හා දිගුකාලීන ණය අරමුදල යටතේ ප්‍රතිමූල්‍ය කරනු ලැබේ. 1983 දී රුපියල් දශ ලක්ෂ 74.8 ක් සඳහා වූ අයදුම්පත් 38 ක් අනුමත කරන ලදී. මෙම ක්‍රමයෙහි II වැනි කාණ්ඩය යටතේ අපනයන නැඹුරුවක් සහිත ව්‍යාපෘතීන් වෙනුවෙන් රුපියල් දශ ලක්ෂ 36.5 ක් සඳහා වූ අයදුම්පත් 18 ක්ද මෙයට ඇතුළත්ය. ප්‍රතිමූල්‍ය අනු මත කිරීම්වල කෑඩි සටහනක් පහත දක්වා ඇත.

**2 . 2 සංඛ්‍යා සටහන**

**මධ්‍ය හා දිගුකාලීන ණය අරමුදල**

**(කාණ්ඩ 11 – IV ප්‍රතිමූල්‍ය අනුමත කිරීම්)**

රුපියල් දශ ලක්ෂ

| කාණ්ඩය | 1981 | | 1982 | | 1983 | |
|---|---|---|---|---|---|---|
| | ණය ප්‍රමාණය | ප්‍රතිමූල්‍ය ප්‍රමාණය | ණය ප්‍රමාණය | ප්‍රතිමූල්‍ය ප්‍රමාණය | ණය ප්‍රමාණය | ප්‍රතිමූල්‍ය ප්‍රමාණය |
| II අපනයන අංශය | 35·4 | 32·0 | 97·7 | 97·7 | 43·7 | 36·5 |
| III හා IV වැනි කාණ්ඩ | | | | | | |
| (අ) කෘෂිකර්මය | 30·8 | 19·1 | 1·0 | 1·0 | 27·8 | 19·2 |
| (ආ) කර්මාන්ත | 76·1 | 68·1 | 65·0 | 53·4 | 9·7 | 7·0 |
| (ඇ) හෝටල් | 105·0 | 83·0 | 75·3 | 72·5 | 13·2 | 8·6 |
| (ඇ) අනෙකුත් | 147·8 | 90·7 | 8·3 | 5·0 | 5·8 | 3·5 |
| එකතුව | 395·1 | 292·9 | 247·3 | 229·6 | 100·2 | 74·8 |

මූලය; ශ්‍රී ලංකා මහ බැංකුව

මධ්‍ය හා දිගු කාලීන ණය අරමුදලින් ප්‍රතිමූල්‍ය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරන ලද අයදුම්පත්වලට 1983 දෙසැම්බර් 31 වැනි දිනට බලපෑ නියමයන් හා කොන්දේසිවල සාරාංශයක් පහත දැක්වේ.

**2 . 3 සංඛ්‍යා සටහන**

**මධ්‍ය හා දිගුකාලීන ණය අරමුදලෙහි ප්‍රතිමූල්‍ය අනුමත කිරීම්වලට අදාළ නියමයන්**

| කාණ්ඩ | ප්‍රතිමූල්‍ය සපයන ප්‍රමාණය (ණය මුදලින් සියයට ගණන) % | ණය මුදලේ කාලය | ප්‍රතිමූල්‍ය පොලී අනුපාතිකය | | ණය දෙන ආයතනයට තබා ගත හැකි පොලී පරතරය | | ව්‍යවසායකයා විසින් මුළු ව්‍යාපෘති පිරිවැය වෙනුවෙන් දැරිය යුතු අවම දායකත්වය % |
|---|---|---|---|---|---|---|---|
| | | | අ | ආ | අ | ආ | |
| | | | මුළු ව්‍යාපෘති පිරිවැය රු. දශ ලක්ෂ 5 හා ඊට අඩු % | මුළු ව්‍යාපෘති පිරිවැය රු. දශ ලක්ෂ 5 ට වැඩි % | මුළු ව්‍යාපෘති පිරිවැය රු. දශ ලක්ෂ 5 හා ඊට අඩු % | මුළු ව්‍යාපෘති පිරිවැය රු. දශ ලක්ෂ 5 ට වැඩි % | |
| I | 100 | අවු. 3 – 15 | 7½ | 7½ | 4 | 4 | 10 |
| II | 70 | අවු. 3—15 | 9 | 10 | 2 | 2 | |
| III | 60 | අවු. 3—15 | 10 | 10 | 4 | 4 | 20 |
| IV | 60 | අවු. 3—15 | 12 | 12 | 4 | 4 | |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

**ණය සහතික ක්‍රම**

මහ බැංකුව විසින් පරිපාලනය කරනු ලබන ණය සහතික ක්‍රම තුනෙහි ක්‍රියාකාරිත්වය සම්පිණ්ඩනය කර 2.4 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

**I. සුළු පරිමාණ කර්මාන්ත (සු. පරි. ක.) ණය සහතික ක්‍රමය**

1978 අප්‍රේල් මාසයේදී ආරම්භ කරන ලද සුළු පරිමාණ කර්මාන්ත ණය සහතික ක්‍රමය (සු. පරි. ක.) යටතේ ණය සහතික නිකුත් කිරීම 1981 දී අවසාන කරන ලදී. මේ ණය පිළිබඳ පසු–විපරම් කටයුතු 1983 දී තීව්‍ර කරනු ලැබීය. මෙම ක්‍රමය යටතේ සහතික වගකීම ණයකරුවන් විසින් ගෙවීම පැහැර හරින ලද ප්‍රමාණයෙන් සියයට 75 කි. 1983 අවසානය වනවිට මහ බැංකුව වෙත හිමිකම් පෑම් 49 ක් ලැබී තිබුණි. මේ අතුරින් රු. 4,14,000 ක ප්‍රමාණයක් සඳහා වූ හිමිකම් පෑම් 20 ක් භාරගනු ලැබ බේරුම් කරන ලදී. රු. 2,00,000 ක් සඳහා වූ එක් හිමිකම් පෑමක් බැංකුව විසින් දන්වා ඇති ණය මුදා හැරීමේ හා පසු—විපරම් පිළිවෙතට අනුකූල නොවූ බැවින් ප්‍රතික්ෂේප කරන ලදී.

**II. සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ( සුමක I ) ණය සහතික ක්‍රමය**

සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත (සුමක I ) ණය සහතික ක්‍රමය යටතේ, සහභාගී ණය දෙන ආයතන විසින් දෙනු ලැබ ජාතික සංවර්ධන බැංකුව විසින් ප්‍රතිමූල්‍යනය කරනු ලබන ණය මහ බැංකුව විසින් සහතික කරනු ලැබේ. මෙම සහතිකවීම කරනු ලබනුයේ, මුදල් නීති පනතේ 108 වන වගන්තිය යටතේය. මෙම ක්‍රමයෙහි කටයුතු 1979 දී ආරම්භ විය.

## 2 . 4 සංඛ්‍යා සටහන

## ශ්‍රී ලංකා මහ බැංකුවේ ණය සහතික ක්‍රම

| | සුළු පරිමාණ කර්මාන්ත සු. පරි. ක. | | | | සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සු. ම. ක. 1 | | | | සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සු. ම. ක. II | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1982 | | 1983 | | 1982 | | 1983 | | 1982 | | 1983 | |
| | සංඛ්‍යාව | අගය රු. ද. ල. | සංඛ්‍යාව | අගය රු. ද. ල. | සංඛ්‍යාව | අගය රු. ද. ල. | සංඛ්‍යාව | අගය රු. ද. ල. | සංඛ්‍යාව | අගය රු. ද. ල. | සංඛ්‍යාව | අගය රු. ද. ල. |
| අනුමත කරන ලද ණය .. | 767 | 31·2 | 767 | 31·2 | 1,541 | 253·7 | 1,585 | 265·7 | 152ඉ | 24·8 | 185 | 43·9 |
| සහතික කරන ලද ණය .. | 767 | 23·4අ | 767 | 23·4අ | 1,541 | 140·1 | 1,585 | 146·5 | 152 | 14·9 | 185 | 25·0 |
| සම්පූර්ණයෙන් ආපසු ගෙවා නිමි ණය .. | 246 | 3·9 | 370 | ලැ. නො. | 37 | 2·7 | 193 | 8·6 | නැත | නැත | 4 | 0·4 |
| කල් ඉකුත් වූ/ඉවත් කර ගන්නා ලද ණය සහතික .. | 59 | 3·2 | 61 | ලැ. නො. | 9 | 1·3 | 29 | 7·7 | නැත | නැත | 11 | 0·8 |
| නොපියවූ ණය .. | 462 | 13·2ආ | 315 | 8·73ආ | 1,495 | 195·1ආ | 1,349 | 159·7 | 152 | 24·8ආ | 170 | 43·0ආ |
| (ඉන් හිඟ හිටි ණය) .. | ලැ.නො. | ලැ. නො. | 224 | ලැ. නො. | ලැ. නො. | ලැ. නො. | 697 | 103·3 | — | — | 45 | 5·4 |
| නොපියවූ ණය සහතික .. | 462 | 9·9අ | 315 | 6·54අ | 1,495 | 110·3ඇ | 1,349 | 90·9 | 152 | 14·9ඇ | 170 | 24·4ඈ |
| වගකීම පිළිගන්නා ලද/පියවන ලද හිමිකම් පෑම | | | | | | | | | | | | |
| 1. නොපියවූ ණය .. | නැත | නැත | 20 | 0·64 | නැත | නැත | 14 | 0·187 | — | — | — | — |
| 2. වගකීම පිළිගත් .. | නැත | නැත | 20 | 0·41 | නැත | නැත | 14 | 0·112 | — | — | — | — |
| කටයුතු අවසන් නොවූ හිමිකම් පෑම | | | | | | | | | | | | |
| 1. නොපියවූ ණය .. | 39 | 1·1 | 29 | 1·66 | 45 | 4·32 | 89 | 12·8 | — | — | — | — |
| 2. හිමිකම් පෑ ප්‍රමාණය .. | 39 | 1·2 | 29 | 1·25 | 45 | 2·59 | 89 | 7·68 | — | — | — | — |

අ. නොපියවූ ණය වලින් සියයට 75 ක ප්‍රමාණය.
ආ. අය කර ගත් ණය වාරික නොමැතිව.
ඇ. රු. 4,00,000 උපරිමයකට යටත්ව නොපියවූ ණය ශේෂයන්ගෙන් සියයට 60 ක ප්‍රමාණය.
ඈ. රු. 8,00,000 උපරිමයකට යටත්ව නොපියවූ ණය ශේෂයන්ගෙන් සියයට 60 ක ප්‍රමාණය.
ඉ. 1983 වර්ෂය තුළදී සුමක 1 යෝජනා ක්‍රමයට මාරු කරන ලද ණය සහතික 9 ක්ද ඇතුළුව.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

ජාත්‍යන්තර සංවර්ධන සංගමයේ ණය මාලාවක් (එ.ජ. ඩොලර් දශ ලක්ෂ 12.0) මගින් අරමුදල් සපයනු ලබන මෙම ක්‍රමය 1983 වනවිට පූර්ණ වශයෙන් ප්‍රයෝජනයට ගෙන තිබිණ. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, 1983 දී ණය දෙන ආයතන වලට නිකුත් කරනු ලැබුවේ ණය සහතික 44 ක් පමණි. 1983 දෙසැම්බර් මස 31 වැනි දින වන විට රු. දශ ලක්ෂ 265.7 ක ණය ප්‍රමාණයක් වෙනුවෙන් සහතික 1585 ක් නිකුත් කර තිබිණ. මෙකී ණය සහතික යටතේ මුළු වගකීම රු. දශ ලක්ෂ 146.5 ක් වූ අතර, ඉන් රු. දශ ලක්ෂ 0.112 ක් වූ හිමිකම් පෑම් 14 ක් භාරගනු ලැබ බේරුම් කරන ලදී. ව්‍යාපෘතීන් 78 ක් අලෙවි කිරීමේ අපහසුකම්, අරමුදල් හිඟකම හෝ අයථා පාලනය නිසා අත්හැර දමා තිබුන බවද සොයාගෙන ඇත. මෙකී ව්‍යාපෘතීන් සඳහා දෙන ලද ණය ප්‍රමාණය රු. දශ ලක්ෂ 8.7ක් වූ අතර, 1983 දෙසැම්බර් මාසයට නොපියවූ ශේෂය රු. දශ ලක්ෂ 6.2 ක් විය. කෙසේ වෙතත්, ඇතැම් අවස්ථා වලදී වෙනත් ආදායම් මාර්ගයන්ගෙන් ණය වාරික ගෙවීම් නොකඩවා කරගෙන එන ලදී. සුමක I ණය කර්මාන්ත අනුව වර්ගකර 2.5 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

UNIVERSITY OF MORATUWA LIBRARY SRI LANKA

### 2 . 5 සංඛ්‍යා සටහන

### සුමක 1 ණය මුදල් — කර්මාන්තමය වර්ගීකරණය

| කර්මාන්ත අංකය | කර්මාන්තය | 1979—1983 ණය මුදල් සංඛ්‍යාව | 1979—1983 ලබාදී ඇති ණය මුදල්වල එකතුව රු. '000 | 1979—1983 ඇප වී ඇති ප්‍රමාණය රු. '000 | 1983 ණය මුදල් සංඛ්‍යාව රු. '000 | 1983 ලබා දී ඇති ණය මුදල්වල එකතුව රු. '000 | 1983 ඇප වී ඇති ප්‍රමාණය රු. '000 |
|---|---|---|---|---|---|---|---|
| 1. | වී කෙටීම .. | 336 | 50,898 | 29,983 | 5 | 1,345 | 807 |
| 2. | ලුහු ඉංජිනේරු .. | 170 | 25,744 | 14,046 | 7 | 2,790 | 1,274 |
| 3. | ගඩොල් හා අනෙකුත් ගොඩනැගිලි ද්‍රව්‍ය .. | 254 | 51,185 | 28,618 | 2 | 279 | 167 |
| 4. | මසා නිමකල ඇඳුම්, බතික්, අත් යන්ත්‍ර රෙදිපිළි, බුමුතුරුණු ආදිය | 140 | 21,131 | 11,081 | 8 | 1,926 | 1,016 |
| 5. | රබර් හා රබර් උපයෝගී කර ගත් භාණ්ඩ .. | 30 | 8,866 | 4,440 | 3 | 945 | 567 |
| 6. | පාවහන් හා අනෙකුත් සම් භාණ්ඩ | 22 | 3,474 | 1,834 | 4 | 1,108 | 465 |
| 7. | හකුරු හා උක් නිෂ්පාදන .. | 7 | 333 | 200 | 1 | 100 | 60 |
| 8. | ගෘහ භාණ්ඩ හා අනෙකුත් දැව නිෂ්පාදන .. | 80 | 8,331 | 4,845 | 1 | 85 | 51 |
| 9. | කොහු හා කොහු ආශ්‍රිත අනෙකුත් නිෂ්පාදන .. | 96 | 9,211 | 5,507 | 1 | 20 | 12 |
| 10. | ලිපි ද්‍රව්‍ය හා අනෙකුත් කඩදාසි නිෂ්පාදන .. | 24 | 4,098 | 2,259 | 1 | 35 | 21 |
| 11. | ආහාර සහ පාන වර්ග .. | 79 | 16,746 | 8,370 | 3 | 480 | 288 |
| 12. | තීන්ත, පොලිෂ්, වාර්නිෂ් ආදිය .. | 10 | 3,677 | 1,871 | 1 | 400 | 240 |
| 13. | ගුවන්විදුලි යන්ත්‍ර, බයිසිකල් ආදිය සඳහා අමතර කොටස් .. | 12 | 1,508 | 800 | — | — | — |
| 14. | සබන් සහ අනෙකුත් සුවඳ විලවුන් වර්ග .. | 29 | 1,616 | 969 | — | — | — |
| 15. | හස්ත කර්මාන්ත හා අනෙකුත් සෙල්ලම් බඩු .. | 21 | 808 | 485 | — | — | — |
| 16. | සුරුට්ටු හා බීඩි .. | 6 | 48 | 28 | — | — | — |
| 17. | ධීවර යාත්‍රා හා මිරිදිය ධීවර කටයුතු | 7 | 4,400 | 1,900 | — | — | — |
| 18. | ස්වර්ණාභරණ හා මැණික් .. | 11 | 656 | 394 | — | — | — |
| 19. | ක්‍රීඩා භාණ්ඩ .. | 3 | 94 | 56 | — | — | — |
| 20. | කෘෂි උපකරණ .. | 10 | 2,702 | 1,221 | — | — | — |
| 21. | වීදුරු හා වෙනත් වීදුරු නිෂ්පාදන | 7 | 1,166 | 700 | — | — | — |
| 22. | පිත්තල හා ඇලුමිනියම් භාණ්ඩ .. | 45 | 6,671 | 3,456 | 1 | 243 | 146 |
| 23. | ලී ඉරීම .. | 47 | 9,229 | 5,530 | 1 | 350 | 210 |
| 24. | මුද්‍රණ කටයුතු .. | 41 | 11,438 | 6,216 | 3 | 1,092 | 655 |
| 25. | විවිධ .. | 98 | 21,698 | 11,620 | 2 | 800 | 430 |
| | එකතුව .. | 1,585 | 2,65,728 | 1,46,429 | 44 | 11,998 | 6,409 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

### III. සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත (සුමක II) ණය සහතික ක්‍රමය.

1982 ජනවාරි මස දී ආරම්භ කරන ලද සුමක II ක්‍රමය සඳහා අරමුදල් ජාත්‍යන්තර සංවර්ධන සංගමයේ එ.ජ. ඩොලර් දශ ලක්ෂ 30 ක ණය මුදලක් මගින් සපයනු ලැබේ. මෙම අරමුදල් යොදවනු ලබන්නේ සහභාගී ණය දෙන ආයතන විසින් දෙනු ලබන සුමක ණය ප්‍රතිමූල්‍යනය කරනු ලබන ජාතික සංවර්ධන බැංකුව මගිනි. මෙම ක්‍රමය යටතේ ව්‍යාපෘතියක් සඳහා දෙනු ලබන වැඩිම ණය මුදල රුපියල් දශ ලක්ෂ 2 කි. ජාතික සංවර්ධන බැංකුව විසින් ප්‍රතිමූල්‍යනය කරන ලද ණය මුදල් මහ බැංකුවේ ණය සහතික සඳහා සුදුසුකම් ලබයි. එක් ණයක් සඳහා මහ බැංකුවේ ණය සහතිකය රුපියල් අට ලක්ෂයක උපරිමයකට යටත්ව පැහැර හැරි ණය ප්‍රමාණයෙන් සියයට 62 ක් වේ. වර්ෂයේ අවසන් කොටසේ දී සුමක II ණය සඳහා පොළී අනුපාතිකය වර්ෂයකට සියයට 20 සිට සියයට 14 දක්වා අඩු කරන ලදී. 1983 වර්ෂය තුළ මෙම ක්‍රමය යටතේ ණය මුදල් 42 ක් සහතික කරනු ලැබීය.

සුමක II ක්‍රමය යටතේ සහතික කරන ලද ණය මුදල් කර්මාන්ත අනුව වර්ග කර 2.6 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

**2 . 6 සංඛ්‍යා සටහන**

**සුමක II ණය මුදල් — කර්මාන්තමය වර්ගීකරණය**

| කර්මාන්ත අංකය | කර්මාන්තය | | 1982—1983 | | | 1983 | |
|---|---|---|---|---|---|---|---|
| | | ණය මුදල් සංඛ්‍යාව | අනුමත කරන ලද ණය ප්‍රමාණය රු. '000 | ඇප වූ ප්‍රමාණය රු. '000 | ණය මුදල් සංඛ්‍යාව | අනුමත කරන ලද ණය ප්‍රමාණය රු. '000 | ඇප වූ ප්‍රමාණය රු. '000 |
| 1. | ආහාර සකස් කිරීම .. | 60 | 12,205 | 6,923 | 11 | 5,573 | 2,944 |
| 2. | වෙනත් කෘෂි කර්මාන්ත .. | 7 | 869 | 521 | 2 | 240 | 144 |
| 3. | රබර් නිෂ්පාදන .. | 3 | 600 | 360 | — | — | — |
| 4. | ලෝහ නිෂ්පාදන .. | 39 | 5,712 | 3,417 | 9 | 1,765 | 1,059 |
| 5. | ගොඩනැගිලි ද්‍රව්‍ය .. | 5 | 1,655 | 993 | 2 | 1,400 | 840 |
| 6. | ඉදිකිරීමේ කොන්ත්‍රාත්තු .. | — | — | — | — | — | — |
| 7. | ද්‍රව නිෂ්පාදන .. | 21 | 5,331 | 3,199 | 3 | 400 | 240 |
| 8. | මැසූ නිමකළ ඇඳුම් .. | 13 | 5,761 | 3,056 | 4 | 4,700 | 2,420 |
| 9. | රෙදිපිළි .. | 2 | 355 | 213 | — | — | — |
| 10. | අළුත්වැඩියා කිරීමේ වැඩපළවල් .. | 1 | 30 | 18 | — | — | — |
| 11. | විවිධ .. | 34 | 11,409 | 6,346 | 11 | 8,075 | 4,345 |
| | එකතුව .. | 185 | 43,927 | 25,046 | 42 | 22,153 | 11,992 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

#### ග්‍රාමීය ණය

වාණිජ බැංකු විසින් ක්‍රියාත්මක කරනු ලබන ග්‍රාමීය ණය යෝජනා ක්‍රමයන් පාලනය කිරීම සහ පරීක්ෂා කිරීමත්, ග්‍රාමීය ණය ක්ෂේත්‍රයට අදාළ ප්‍රතිපත්තිමය තීරණ ගැනීමේදී ඒවා පිළිබඳ තීරණාත්මක බලපෑම් ඇතිකිරීමත්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කර ගෙන යනු ලබයි. තවද, ග්‍රාමීය අංශයේ කෙටි, මැදි හා දිගු කාලීන ණය අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා අවශ්‍ය අරමුදල් ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිමූල්‍ය පහසුකම් යටතේ වාණිජ බැංකුවලට ලබාදීමත්, එම ප්‍රතිමූල්‍ය ප්‍රයෝජනයට ගැනීම පිළිබඳ නියමයන් සහ කොන්දේසි නියම කිරීමත් මහ බැංකුව විසින් වාණිජ බැංකුවල ග්‍රාමීය ණය යෝජනා ක්‍රමයන්ට මැදිහත්වීමේ කාර්යයේදී සිදුවේ. වාණිජ බැංකු ශාඛාවන්ගේ ග්‍රාමීය ණය ශීර්ෂයන් පිළිබඳව ග්‍රාමීය ණය දෙපාර්තමේන්තුව විසින් කලින් කලට සිදුකරනු ලබන නිරීක්ෂණයන් තුළින් එම බැංකු පරීක්ෂා කිරීමේ

කාර්යයද මහ බැංකුව මගින් ඉටු කෙරේ. ග්‍රාමීය බැංකු ශාඛා පරීක්ෂා කිරීමේ මෙම කාර්යය පසුගිය වර්ෂයේ අවසානයේදී ආරම්භ කරන ලද්දකි. ග්‍රාමීය ණය සම්බන්ධ ප්‍රතිපත්ති සම්පාදන කාර්යයේදී මූලිකත්වය දැරීම සඳහා 1981 අගෝස්තු මාසයේදී ආරම්භ කරන ලද ග්‍රාමීය ණය උපදේශක මණ්ඩලය සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළදී රැස්වීම් වාර 6 ක් පවත්වා ඇත. එහිදී ග්‍රාමීය ණය ක්ෂේත්‍රයට අදාළ ප්‍රතිපත්තිමය තීරණයන් කීපයක් ක්‍රියාත්මක කිරීම සඳහා සලකා බලනු ලැබීය.

ග්‍රාමීය ණය උපදේශක මණ්ඩලය විසින් සලකා බලන ලද යෝජනාවන් අතර, ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු පිහිටුවීම, රබර් වගා කරන්නන්ට ආධාර පිණිස ණය යෝජනා ක්‍රමයක් ඇතිකිරීම, උක් වගාව සඳහා ණය යෝජනා ක්‍රමයක් ඇතිකිරීම සහ ග්‍රාමීය ණය ක්‍රමයන් ක්‍රියාත්මක කිරීමේදී රාජ්‍ය අංශයේ බැංකුවලට සාධාරණ මට්ටමක ලාභදායීතාවයක් ලබා ගැනීම පිළිබඳ යෝජනාවන් ප්‍රධාන ඒවා විය. ප්‍රාදේශීය ග්‍රාම සංවර්ධන බැංකු පිහිටුවීම පිළිබඳ පනත් කෙටුම්පත දැනට පිළියෙල වෙමින් පවතී. රබර් අංශය සඳහා ණය ක්‍රමය, දැනට ක්‍රියාත්මක වෙමින් පවතින රබර් පාලක තැනගේ සහනාධාර වැඩ පිළිවෙලට අතිරේක වශයෙන් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වනු ලැබේ. රබර් නැවත වගා කරන සෑම වාරයක් ආරම්භයේදීම එම කටයුතු කරගෙන යෑම සඳහා අවශ්‍ය මූල්‍ය පහසුකම් ලබාදීම මෙම යෝජිත ණය ක්‍රමයේ ප්‍රධාන අරමුණ වේ. මෙම යෝජනාව දැනට පරීක්ෂාවට භාජනය වෙමින් පවතී. උක් වගාව ප්‍රමුඛතා අංශයක් වශයෙන් දිරිගැන්විය යුතු වගාවක් ලෙස ග්‍රාමීය ණය උපදේශක මණ්ඩලය තීරණය කර ඇති අතර, එමගින් රටේ ගොවි ජනතාවගේ භෝග වගාවේ විවිධාංගීකරණයක් ඇතිකිරීමේ හැකියාවත්, ශ්‍රී ලංකාවට සීනිවලින් ස්වයංපෝෂිතභාවය ලඟාකර ගැනීමේ අවස්ථාවක් උදාකර ගත හැකි වේයයි සලකා ඇත. ඒ අනුව රාජ්‍ය අංශය විසින් හෝ පුද්ගලික අංශයේ සංවිධාන විසින් හෝ සීනි කර්මාන්තශාලා පිහිටුවා ඇති ප්‍රදේශවල උක් වගා කරන ගොවීන්ට, මැදි කාලීන හා දිගු කාලීන ණය වැඩ පිළිවෙල යටතේ ණය සැපයීමට වාණිජ බැංකු යොමු කරවීමට බලාපොරොත්තු වනු ලැබේ.

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළදී ග්‍රාමීය ණය දෙපාර්තමේන්තුව විසින් ප්‍රාථමික සමුපකාර හා සකසුරුවම් සමිති සඳහා ණය යෝජනා ක්‍රමයක් සංවිධානය කිරීම පිණිස අවශ්‍ය පියවර ගන්නා ලදී. දැනට යම් යම් සීමාවන් තුළ කටයුතු කිරීමට සිදුවී තිබෙන එවැනි සමිති වලට අවශ්‍ය මූල්‍ය සම්පත් මෙම යෝජිත ණය ක්‍රමයෙන් ලබාදීමට අපේක්ෂා කරනු ලැබේ. 1984 වර්ෂයේ මුල් කාලය තුළදී මෙම යෝජනා ක්‍රමය හඳුන්වා දීමත් සමගම, මෙම සමිති ග්‍රාමීය අංශයට ණය ලබාදෙන ප්‍රධාන ආයතන බවට පත් කිරීමටත්, එමගින් දැනට වඩා පුළුල් කාර්යභාරයක් ග්‍රාමීය ණය කටයුතු සම්බන්ධයෙන් ඉටු කිරීමට එම සමිතිවලට හැකියාවක් ලබාදීමටත්, ඉඩ ප්‍රස්තා සැලසේ යයි විශ්වාස කරනු ලැබේ.

ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ක්‍රියාත්මක කරනු ලබන මැදි හා දිගු කාලීන ණය අරමුදලේ පළමුවැනි කාණ්ඩය යටතේ දැනට ක්‍රියාත්මක වන ණය යෝජනා ක්‍රමයන් ගැන තොරතුරු 2.7 සංඛ්‍යා සටහනින් දැක්වේ. මෙම ණය යෝජනා ක්‍රම, ශ්‍රී ලංකා මහ බැංකුවේ මූලිකත්වය සහිතව (උදාහරණයක් වශයෙන්, ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාල මගින් ක්‍රියාත්මක කෙරෙන ණය යෝජනා ක්‍රම) හෝ වෙනත් බැංකු හෝ රජයේ සංවර්ධන ආයතනවලින් කෙරෙන එවැනි ඉල්ලීම් වලට ප්‍රතිචාරය දැක්වීමක් වශයෙන් හෝ ක්‍රියාත්මක කරනු ලැබේ. ඒවායින් සමහරක් ජාත්‍යන්තර සංවර්ධන සමායතනය, (අයිඩීඒ) ආසියානු සංවර්ධන බැංකුව. (ඒඩීබී), කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල (අයිඑෆ්ඒඩී) වැනි ආයතනවලින් ආධාර ලබන ව්‍යාපෘතීන් හා සම්බන්ධ වේ. මෙම ණය යෝජනා ක්‍රම සම්බන්ධ ප්‍රධාන ගැටළුවක් වී ඇත්තේ එක් එක් ණය යෝජනා ක්‍රමය සඳහා වෙන් කරන ලද අරමුදල් ප්‍රමාණවත් අන්දමින් ප්‍රයෝජනයට නොගැනීමයි. එම ණය යෝජනා ක්‍රම සඳහා මුළු වෙන්කිරීම් රුපියල් දශ ලක්ෂ 654 ක් වන අතර, සමාලෝචනයට භාජනය වන වසර අවසාන වන

විට එයින් රුපියල් දශ ලක්ෂ 421.15 ක්ම ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. මෙය, 1978 දී 1 වැනි කාණ්ඩයේ ණය යෝජනා ක්‍රමය ආරම්භ කළ තැන් පටන් ග්‍රාමීය අංශය සඳහා ණය සැපයෙන මැදි හා දිගු කාලීන ණය අරමුදලේ කැපී පෙනෙන ලක්ෂණයක් වී ඇත. කෙසේ වුවද, සමහර යෝජනා ක්‍රමයන්ගෙන් බලාපොරොත්තු වූ ඉලක්කයන් සපුරාගත නොහැකි වූයේ බැංකුවල පාලනයෙන් බැහැරව පැවති හේතූන් යටතේය. උදාහරණයක් ලෙස, කිරි නිෂ්පාදන අංශය සලකන කල, ඒ සඳහා යහපත් සෞඛ්‍ය තත්ත්වයෙන් යුතු හා නිවැරදි වයස් කාණ්ඩයේ සතුන් ලබා ගැනීම දුෂ්කරවූයේ සතුනට වැළඳී රෝගයක් හේතු කොට ගෙනය. සමහර යෝජනා ක්‍රමයන් පිළිබඳව, මූලික ක්‍රම සම්පාදනයේ වූ දුර්වලතාත්, ඒවා නිසි පරිදි සැළසුම් නොකිරීමත් වැනි කරුණු, එම ව්‍යාපෘතීන්ගෙන් බලාපොරොත්තු වූ ඉලක්කයන් කරා ලඟාවීමට අපොහොසත් වීම පිළිබඳ තත්ත්වයට වැඩිපුර වග කිව යුතුය. නිදසුනක් වශයෙන් ශ්‍රී ලංකා ග්‍රාමීය ණය යෝජනා ක්‍රමයේ සහ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඒකාබද්ධ ග්‍රාම සංවර්ධන ව්‍යාපෘතිය සඳහා රෝද හතරේ ට්‍රැක්ටර් වෙනුවෙන් වෙන් කරන ලද මුදල් සියල්ල ප්‍රයෝජනයට නොගැනීම දක්විය හැක. ඊට ප්‍රධාන හේතුව වූයේ ඉන්ධන මිළ බෙහෙවින් ඉහළ යාම හේතු කොටගෙන රෝද හතරේ ට්‍රැක්ටර් සඳහා බලාපොරොත්තු වූ තරම් ඉල්ලුමක් ගොවීන්ගෙන් නොලැබීමයි. කෙසේ වුව ද, අනෙකුත් යෝජනා ක්‍රමයන් සඳහා වෙන් කරන ලද මුදල් ප්‍රමාණයන් ප්‍රයෝජනයට ගැනීමේදී සැළකිය යුතු මට්ටමක ප්‍රගතියක් පෙන්වීමට ණය බෙදා හරිනු ලබන බැංකු විසින් සහ ඒ හා සම්බන්ධ අනෙකුත් සම්බන්ධීකරණ ආයතන විසින් බලවත් පරිශ්‍රමයක් දරනු ලැබීය. විවිධ යෝජනා ක්‍රමයන්ගෙන් සැළසුම් කරන ලද ඉලක්කයන් සපුරා ගැනීම සහතික කරනු වස් බැංකුවලට වැඩි වැඩියෙන් පුහුණු මිනිස් බලයත්, ඒ සඳහා ඔවුන්ගේ දැඩි කැපවීමකුත් අවශ්‍ය වේ.

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළදී පහත සඳහන් ණය යෝජනා ක්‍රමයන් හඳුන්වා දෙනු ලැබීය:

(1) නුවරඑළිය සහ බදුල්ල යන දිස්ත්‍රික්කයන්හි, ගොවිපලවල පවත්වාගෙන යනු ලබන කුඩා ප්‍රමාණයේ බීජ අර්තාපල් ගබඩා ඉදිකිරීම සඳහා ණය පහසුකම් සැපයීම.

(2) බදුල්ල දිස්ත්‍රික්ක ඒකාබද්ධ ග්‍රාම සංවර්ධන වැඩ පිළිවෙල යටතේ කෘෂිකාර්මික ණය පහසුකම් ලබාදීම.

මේ හැරුණුකොට, දැනට පවතින ණය පහසුකම් වලින් ප්‍රයෝජන ලබන්නවුන්ට යම්කිසි සහනයක් සැලසීම සඳහා එම ණය ක්‍රමයන්හි ගැලපීම් කිහිපයක් සිදුකරන ලදී. ධීවර අංශය සඳහා වූ බැංකු ණය යෝජනා ක්‍රමයේ, කුඩා ධීවර යාත්‍රා සඳහා වූ ණය ආපසු ගෙවීමේ කාලසීමාව දීර්ඝ කරන ලදී. එසේ කරන ලද්දේ ණය ලබාගන්නන්ට ණය ආපසු ගෙවීම පහසු කරවීමේ සහනදායී පියවරක් වශයෙනි. තවත් සමහර යෝජනා ක්‍රම කිහිපයක් සඳහා වූ ද්‍රව්‍යමය වෙන්කිරීම්හි වෙනස්කම් කිහිපයක් සිදුකරන ලද අතර, දැනටමත් ගොවීන්ගෙන් ඉල්ලුමක් තිබෙන කෘෂිකාර්මික උපකරණ සඳහා අරමුදල් නැවත වෙන් කිරීමක් ද සිදුකරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුවේ, මාතර ප්‍රාදේශීය කාර්යාලය විසින් ක්‍රියාත්මක කරන ලද ස්වයං රැකියා සහ ගම් නගා සිටුවීමේ යෝජනා ක්‍රමය 1982 වර්ෂය තුළදී ලත් අත්දැකීම් පදනම් කොටගෙන ඒ සඳහා ලබා දුන් ණය මුදල රුපියල් 6,000 සිට 12,000 දක්වා වැඩි කරන ලදී. එමගින් ප්‍රදේශයේ ඊට වඩා විශාල ව්‍යාපෘති සඳහා ණය ලබා දීමට ද, ප්‍රාදේශීය කාර්යාලයට හැකියාවක් ලැබුණි. ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලයෙන් ක්‍රියාත්මක කරනු ලබන මෙම යෝජනා ක්‍රමය යටතට මොණරාගල සහ හම්බන්තොට යන දිස්ත්‍රික්කද ඇතුළත් කරන ලද අතර ඒ දිස්ත්‍රික්ක සඳහා වූ වාරිමාර්ග ණය සහ රෝද දෙකේ ට්‍රැක්ටර් ඇතුළු අනෙකුත් ගොවිපල බලවේග යන්ත්‍ර සඳහා වූ ණය ද මෙම යෝජනා ක්‍රමය යටතට පත්කරනු ලැබිණ.

## 2 . 7 සංඛ්‍යා සටහන

### ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිමූල්‍ය පහසුකම් ලබන පළමුවැනි කාණ්ඩය යටතේ, ප්‍රතිමූල්‍ය ලබාදීම සඳහා මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලද ණය යෝජනා ක්‍රමය

| ණය යෝජනා ක්‍රමයේ නම | වෙන්කරන ලද ප්‍රතිමූල්‍ය (රු. දශ ලක්ෂ) | 83. 12. 31 දින වන විට එයින් ප්‍රයෝජනයට ගෙන ඇති ප්‍රමාණය (රු. දශ ලක්ෂ) | 83. 12. 31 දින වන විට එයින් ප්‍රයෝජනයට නොගෙන තිබූ ප්‍රමාණය (රු. දශ ලක්ෂ) | ව්‍යාපෘතිය ආරම්භ කළ දිනය | වෙන්කරන ලද ප්‍රතිමූල්‍ය ප්‍රයෝජනයට ගතහැකි කාලය (අවුරුදු) |
|---|---|---|---|---|---|
| **(අ) 1983 වර්ෂය ආරම්භයේදී තිබූ ණය යෝජනා ක්‍රම** | | | | | |
| 1. උඩවැඩියා වගාව සඳහා ණය යෝජනා ක්‍රමය - ලංකා බැංකුව/සීමාසහිත ලංකා දුම්කොළ සමාගම .. .. .. | 4·50 | 3·49 | 1·01 | 03. 01. 79 | 3 |
| 2. පොල් පොහොර ණය යෝජනා ක්‍රමය .. .. | 50·00 | 48·16 | 1·84 | 26. 03. 79 | 3 |
| 3. ධීවර අංශය සඳහා බැංකු ණය යෝජනා ක්‍රමය .. .. | 140·00 | 113·09 | 26·91 | 02. 07. 79 | 3 |
| 4. වැව්, වාරිමාර්ග නවීකරණ යෝජනා ක්‍රමය .. .. | 7·69 | 7·69 | — | 02. 06. 79 | 1 |
| 5. නුවරඑළිය දිස්ත්‍රික්කයේ කිරිපට්ටි පාලන සංවර්ධන ණය යෝජනා ක්‍රමය .. | 10·00 | 8·10 | 1·90 | 22. 08. 79 | 3 |
| 6. කුරුණෑගල දිස්ත්‍රික් ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන යෝජනා ක්‍රමය යටතේ ගොවිපල යන්ත්‍රෝපකරණ සඳහා වන ණය යෝජනා ක්‍රමය .. | 40·00 | 21·50 | 18·50 | 28. 10. 79 | 5 |
| 7. සමන්තුරේ මැතිවරණ කොට්ඨාශය තුළ කිරිපට්ටි පාලන සංවර්ධන (නියමු) ණය යෝජනා ක්‍රමය .. .. .. | 0·12 | — | 0·12 | 27. 11. 79 | 3 |
| 8. මහවැලි සංවර්ධන ව්‍යාපාරය තුළ පදිංචිකරුවන්ට ට්‍රැක්ටර් මිලදී ගැනීම සඳහා වන ණය යෝජනා ක්‍රමය .. .. | 55·00 | 5·40 | 49·60 | 19. 11. 79 | 3 |
| 9. විවිධ සේවා සමුපකාර සමිති විසින් ඉදිකරන පොහොර ගබඩා සඳහා ණය යෝජනා ක්‍රමය .. .. .. | 14·00 | 8·81 | 5·19 | 13. 10. 80 | 1 |
| 10. වයඹ දිග වෙරළේ ධීවර සංවර්ධන ව්‍යාපෘතිය සඳහා අබුඩාබි රජයෙන් ආධාර ලබන ණය යෝජනා ක්‍රමය .. .. | 60·00 | — | 60·00 | 13. 10. 80 | 3 |
| 11. උඩවැඩියා වගාව සඳහා වන ණය යෝජනා ක්‍රමය – මහජන බැංකුව/සර්වෝදය/ලක්මල්සල .. .. | 3·00 | 0·23 | 2·77 | 10. 12. 80 | 5 |
| 12. ධීවර සමුපකාර සඳහා ණය යෝජනා ක්‍රමය .. .. | 42·00 | — | 42·00 | 28. 04. 81 | 2 |
| 13. මාතලේ/පුත්තලම දිස්ත්‍රික් ඒකාබද්ධ ග්‍රාම සංවර්ධන යෝජනා ක්‍රමය .. | 54·23 | 6·63 | 47·60 | 08. 05. 81 | 6 |
| 14. සුළංබල යන්ත්‍ර සඳහා මූල්‍ය පහසුකම් සැපයීමේ ණය යෝජනා ක්‍රමය .. | 2·56 | 1·05 | 1·51 | 11. 12. 81 | 1 |
| 15. මාතර දිස්ත්‍රික්කයේ තරුණ තරුණියන් සඳහා ස්වයං රැකියා යෝජනා ක්‍රමය .. | 7·20 | 0·66 | 6·54 | 10. 04. 81 | -- |
| 16. රදම්පොල උඩ අපරැක්ක ගම් නගා සිටුවීමේ ව්‍යාපාරය .. .. | — | — | — | 16. 03. 81 | — |
| 17. ශ්‍රී ලංකා ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය .. .. | 137·00 | 4·16 | 132·84 | 01. 07. 82 | 1 |
| 18. කුඩා තේ ඉඩම් හිමියන් සඳහා වන පොහොර ණය යෝජනා ක්‍රමය .. | 7·50 | 4·04 | | | |
| 19. ශ්‍රී ලංකා ග්‍රාමීය ණය යෝජනා ක්‍රමයෙන් ආවරණය නොවන දිස්ත්‍රික්ක සඳහා බර අදින සතුන් මිලදී ගැනීම සඳහා මූල්‍ය පහසුකම් සැපයීමේ ණය යෝජනා ක්‍රමය .. | 5·60 | 0·01 | 3·46 | 11. 08. 82 | 1 |
| 20. ගම් නගා සිටුවීම හා ස්වයං රැකියා වැඩ පිළිවෙල යටතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ හඳුනාගන්නා ලද ව්‍යාපෘති සඳහා මූල්‍ය පහසුකම් සැපයීමේ ණය යෝජනා ක්‍රමය .. | 6·00 | 0·23 | 5·59<br>5·77 | 10. 09. 82<br>14. 10. 82 | 2<br>2 |
| **(ආ) 1983 වර්ෂය තුළදී අනුමත කරන ලද ණය යෝජනා ක්‍රම** | | | | | |
| 1. ගොවිපලවල පවත්වාගෙන යනු ලබන කුඩා පරිමාණයේ බීජ අර්තාපල් ගබඩා ඉදිකිරීම සඳහා ණය යෝජනා ක්‍රමය .. .. | 1·00 | — | 1·00 | 01. 03. 83 | 1 |
| 2. බදුල්ල දිස්ත්‍රික්කයේ ඒකාබද්ධ ග්‍රාම සංවර්ධන ණය යෝජනා ක්‍රමය .. | 7·00 | — | 7·00 | 27. 09. 83 | 5 |
| එකතුව .. .. | 654·40 | 233·25 | 421·15 | | |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

මේ හා සමානවූ ණය යෝජනා ක්‍රමයක් අනුරාධපුර දිස්ත්‍රික්කයේද ක්‍රියාත්මක කරනු ලැබේ. මෙම වැඩපිළිවෙලේ වැදගත් අරමුණක් වන්නේ පොම්ප කට්ටල සහ සුලංබල යන්ත්‍ර උපයෝගී කරගෙන, කණින ලද විවෘත ළිං මාර්ගයෙන් භූගත ජලය ප්‍රයෝජනයට ගනිමින් සුළු වාරිමාර්ග ක්‍රම දියුණු කිරීමයි.

ආසියානු සංවර්ධන බැංකුවේ ආධාර ලද ශ්‍රී ලංකා ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය වර්ෂය තුළදී සතුටුදායක ප්‍රගතියක් දක්වීය. මෙම ණය යෝජනා ක්‍රමයේ සම්බන්ධීකරණ ආයතනය ලෙසින් ශ්‍රී ලංකා මහ බැංකුවට වැදගත් කාර්ය භාරයක් පැවරී තිබිනි. රෝද දෙකේ ට්‍රැක්ටර් සඳහා වූ ඉල්ලුම ඒවායේ විකිණීම සඳහා ලබා ගත හැකි වූ ප්‍රමාණය ද ඉක්මවූ අතර, එම ට්‍රැක්ටර් විකුණා අවසන් කිරීමට අපේක්ෂා කරන ලද්දේ 1984 වර්ෂයේ මුල් කාර්තුව තුළදීය. ජාතික ජල සම්පත් මණ්ඩලය ප්‍රධාන මෙහෙයවීම් ආයතනය ලෙසින් කටයුතු කරන ලද වාරිමාර්ග ව්‍යාපෘතිය යටතේද වර්ෂය තුළදී දියුණුවක් පෙන්වා තිබේ. ඒ සඳහා අවශ්‍ය උපකරණ 1984 වර්ෂය මුලදී ලබා ගැනීමට හැකිවන පරිදි අවශ්‍ය විධිවිධාන යෙදීමට ජාතික ජල සම්පත් මණ්ඩලය බලාපොරොත්තු වනු ලැබේ.

1982 දී ආරම්භ කරන ලද '' කල්පසු වූ ණය ගෙවීම පහසු කරවනු සඳහා ප්‍රතිලේඛනගත කිරීමේ වැඩ පිළිවෙල '' මෙම වර්ෂය පුරාම ක්‍රියාත්මක වූ අතර, ඒ සඳහා අයදුම් පත් භාර ගැනීමේ අවසාන දිනය 1984 ජූනි 30 දක්වා දීර්ඝ කරන ලදී. කෙසේ වුවද, එම වැඩ පිළිවෙලෙහි ප්‍රගතිය එතරම් සතුටුදායක නොවීය. මෙම වැඩ පිළිවෙලට සම්බන්ධ වීමට කැමැත්ත පල කරන ලද අයදුම්කරුවන්ගේ සංඛ්‍යාව 2,050 ක් පමණ වූ අතර, ලංකා බැංකුවේ වගා ණය ආපසු නොගෙවන ලද අයගේ සංඛ්‍යාව 82,300 ක් පමණ වී මෙන් ඒ බව පෙනේ.

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වානිජ බැංකු සහ සමුපකාර ග්‍රාමීය බැංකු 19 ක ග්‍රාමීය ණය පිළිබඳ වැඩ කටයුතු පරීක්ෂාවට භාජනය කරන ලදී. ගාල්ල, පොලොන්නරුව, හම්බන්තොට, කුරුණෑගල සහ මොනරාගල දිස්ත්‍රික්කවල පිහිටි මහජන බැංකු ශාඛා 7 ක් ද සමුපකාර ග්‍රාමීය බැංකු 7 ක්ද, ලංකා බැංකු ශාඛා 3 ක් සහ ලංකා බැංකුවට සම්බන්ධ ගොවිජන සේවා මධ්‍යස්ථාන ශාඛා 2 ක් ද ඒවාට අයත් වේ. මෙම පරීක්ෂණ වාර්තා පිළියෙල කොට අදාල බැංකුවලට නිකුත් කොට ඇති අතර, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ඔවුන් විසින් ක්‍රියාත්මක කරන ආකාරය පිළිබඳ වාර්තාවක් මහ බැංකුව වෙත එවන ලෙසද ඒ සමගම ඉල්ලීමක් කෙරුණි.

ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලය මගින් මූල්‍ය පහසුකම් සලසන ලද ව්‍යාපෘතීන් වෙනුවෙන් ප්‍රදානය කරන ලද ණය ආපසු ගෙවීමේ ප්‍රගතිය මැනීම සඳහා මැදිකාලීන සමීක්ෂණයක් පවත්වන ලද අතර එම සමීක්ෂණ වාර්තාව වර්ෂය තුළදීම පිළියෙල කොට නිකුත් කරන ලදී. මීට අමතරව සුළු පරිමාණ උඩවැඩියා වගාකරුවන්ට සපයන ලද බැංකු ණය පහසුකම් ප්‍රයෝජනයට ගැනීම පිළිබඳව සහ කළුතර දිස්ත්‍රික්කයේ ධීවරයින් සඳහා දෙන ලද බැංකු ණය පිළිබඳව ද වර්ෂය තුළදී පවත්වන ලද ක්ෂේත්‍ර සමීක්ෂණ පිළිබඳ වාර්තා පිළියෙල කොට අවසන් කරන ලදී.

**සමීක්ෂණ**

1978/79 පාරිභෝගික මුදල් හා සමාජ ආර්ථික සමීක්ෂණ වාර්තාවේ 1 වැනි කොටස 1983 මාර්තු මාසයේදී නිකුත් කරන ලදී. මෙම වාර්තාව සංක්ෂිප්ත සංඛ්‍යා සටහන් දක්වමින් සමීක්ෂණ දත්ත විග්‍රහ කරයි. 1981/82 පාරිභෝගික මුදල් හා සමාජ ආර්ථික සමීක්ෂණයේ දත්ත වර්ග කිරීම, 1983 දී අවසාන කරන ලදී. වාර්තාවේ කොටස් දෙකම 1984 වර්ෂය මැද භාගයේදී නිකුත් කිරීමට බලාපොරොත්තු වේ.

රටේ ඇති, ප්‍රසිද්ධ සහ පෞද්ගලික සීමාසහිත වෙළෙඳ සමාගම්වල ක්‍රමානුකූල ආයෝජන සහ ව්‍යාපාර කටයුතු පිළිබඳව සමීක්ෂණයක් 1983 ජූනි සිට ඔක්තෝබර් දක්වා පවත්වන ලදී. මේ පිළිබඳ වාර්තාව 1984 අප්‍රේල් මාසයේදී පිට කරනු ඇත.

සේවා නියුක්තිය සහ සේවා වියුක්තිය පිළිබඳව අඛණ්ඩව පැවැත්වීමට නියමිත සමීක්ෂණයකට අදාළ ක්‍රම සම්පාදනය හා ක්‍රියාත්මක කිරීමේ සම්බන්ධිත මූලික වැඩ කටයුතු 1983 දෙවැනි භාගයේදී ආරම්භ කරන ලදී. මෙය රටෙහි සේවා නියුක්තිය, සේවා වියුක්තිය සහ ඌණ සේවා වියුක්තිය පිළිබඳව ගැඹුරු අධ්‍යයනයක් වනු ඇත. 1984 ජූලි මාසයේ සිට සෑම පස් වසරකටම වරක් සන්සන්දනය කර බැලීමේ සමීක්ෂණයක් පැවැත්වීමට අදහස් කෙරේ. වෙනස්වීම් වලට නිතර භාජනය වන්නාවූ ප්‍රධාන විචල්‍යයන් මත, ත්‍රෛමාසික දත්ත මාලාවක් ගොඩනැගීමේ හැකියාව පිළිබඳවද පරීක්ෂා කරගෙන යනු ලැබේ.

ලෝක බැංකුවේ සම්බන්ධය ඇතිව '' 1970 සිට ශ්‍රී ලංකා ජීවන තත්ත්වයේ පරිනාමය හා ප්‍රතිපත්ති '' යන මාතෘකාව යටතේ අධ්‍යයනයක් කිරීමට භාරගෙන ඇත. රජය විසින් ආරම්භ කරන ලද ප්‍රතිපත්තීන් නිසා, පසුගිය දශකයේදී සිදුවූ ශ්‍රී ලංකාවේ ජීවන තත්ත්වයේ උපනතීන් පිළිබඳ විග්‍රහයක් කිරීම මෙම අධ්‍යයනයේ අරමුණ වේ.

ආනයන සඳහා වූ ණයවර ලිපි පිළිබඳව මාසික දත්ත ලබා ගැනීමෙන් විවෘත ආනයන වැඩපිළිවෙල සමීක්ෂණය කිරීම බැංකුව විසින් තවදුරටත් කරගෙන යනු ලැබීය.

**ග්‍රාමීය බැංකු හා මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලය**

වෙළෙඳ බැංකු හා අනෙකුත් මූල්‍ය ආයතනවල මැදි හා ජ්‍යෙෂ්ඨ පරිපාලන නිලධාරීන් 554 දෙනෙකු සහභාගී වූ, පුහුණු පාඨමාලා, සම්මන්ත්‍රණ සහ වැඩ මුළු 21 ක් ග්‍රාමීය බැංකු හා මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලය විසින් සංවිධානය කොට පවත්වන ලදී. ''විදේශ විනිමය පාලනය සහ අන්තරායන් '' නමින් වූ එක් පාඨමාලාවක්, කොළඹ සිටි බැංකුවේ අනුග්‍රහය ඇතිව පවත්වන ලද අතර, '' පුහුණුකරුවන් පුහුණු කිරීමේ පාඨමාලාව,'' විශේෂ වැඩ පිළිවෙලක් යටතේ මෙරටට පැමිණි විදේශීය උපදේශක කණ්ඩායමක් විසින් පවත්වනු ලැබීය.

ණය කළමනාකරණය, ව්‍යාපෘති හඳුනාගැනීම හා අගැයීම, වාණිජ බැංකු කටයුතු, ප්‍රාග්ධන වෙළෙඳපොල කටයුතු, කළමනාකාරිත්ව සංවර්ධනය, සත්ව පාලන ක්‍රම මූල්‍යනය කිරීම, කුඩා වැව්, මුහුදු හා අභ්‍යන්තර ධීවර කටයුතු, වණික් බැංකු කටයුතු හා එතෙර බැංකු කටයුතු යනාදියට අදාල ක්ෂේත්‍ර ඉහත කී පාඨමාලාවලට අන්තර්ගත විය.

ග්‍රාමීය බැංකු කටයුතු හා ණය ක්‍රම පිළිබඳව නිලධාරීන් පුහුණු කිරීම, ප්‍රමුඛත්ව ක්ෂේත්‍ර ලෙස සලකන ලදී. දුර බැහැර පළාත්වල පවා, වැඩ පිළිවෙළවල් පවත්වනු ලැබීය.

විද්‍යාලයේ ක්‍රියාකාරී දෙවැනි අවුරුද්ද 1983 සැප්තැම්බර් මාසයේදී අවසාන විය. '' සංවර්ධනයෙහිලා බැංකු සතු කාර්ය භාරය '' යන මාතෘකාව යටතේ, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ලේකම්, ආචාර්ය ඩබ්ලිව්. එම්. තිලකරත්න මහතා විසින් විද්‍යාලයේ දෙවැනි සාංවත්සරික දේශනය පවත්වන ලදී.

**ප්‍රකාශන**

මුදල් නීති පනතේ 35 වගන්තිය ප්‍රකාර 1982 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාව ගරු මුදල් හා ක්‍රම සම්පාදන ඇමතිතුමා වෙත පිළිගන්වන ලදී. 1982 වර්ෂයේ ආර්ථික විවරණයද, වර්ෂයේ පසු භාගයේදී ප්‍රකාශයට පත් කරන ලද අතර මාසික විවරණිකාව නොකඩවා පල කෙරුණි.

වර්ෂය තුළදී මාණ්ඩලික පත්‍රිකා දෙකක් එනම්, 11 වැනි වෙළුමේ අංක 1 හා 2 ද, 12 වැනි වෙළුමේ අංක 1 ද පල කරනු ලැබීය. ආර්ථික හා සාමාජික සංඛ්‍යාන 5 වැනි වෙළුම ද පල කරන ලද අතර, ආර්ථිකයේ මූලික දත්ත ඇතුළත් සමාජ-ආර්ථික දත්ත—1982 පත්‍රිකාවක් නිකුත් කරන ලදී. දිවයින පුරා දත්ත රැස් කිරීමේ ක්‍රමය යටතේ රැස් කරන ලද දත්ත ඇතුළත් මිළ හා වැටුප් සංඛ්‍යාන – 1982 සමාලෝචිත වර්ෂය තුළදී නිකුත් කරනු ලැබීය.

මීට අමතරව '' ශ්‍රී ලංකාවේ බැංකු කටයුතු පිළිබඳ අත්පොත '' නමින් පොත් පිංචක් සහ '' අපනයන සඳහා මූල්‍ය පහසුකම් '' යන මාතෘකාව යටතේ ණය විවරණිකා අංක 3 ද ප්‍රකාශයට පත් කරන ලදී. '' ග්‍රාම සංවර්ධන ප්‍රාරම්භණ '' නමින් අධිපති තුමාගේ කථාවක් අඩංගු වෙනත් කෘති අංක 5 සහ ආචාර්ය ඩබ්ලිව්. එම්. තිලකරත්න මහතා විසින් ග්‍රාමීය බැංකු සහ මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලයීය දෙවැනි සංවත්සරයේදී '' සංවර්ධනයෙහි ලා බැංකු සතු කාර්ය භාරය '' නමින් කළ කථාව අඩංගු වෙනත් කෘති අංක 6 ද පල කෙරුණි.

බැංකුවේ '' නිව්ස් සර්වේ '' ඉංග්‍රීසි ප්‍රකාශනය සහ '' සටහන '' සිංහල ප්‍රකාශනය නොකඩවා ප්‍රකාශයට පත් කරන ලද අතර, ඒ සඳහා ඇති ඉල්ලුම අනුව බලනවිට මෙකී ප්‍රකාශන දෙකම පාඨක ජනතාව අතර ජනප්‍රිය වී ඇති බව පෙනේ.

**පුහුණු කිරීම**

අධ්‍යාපනික හා ප්‍රායෝගික යන ක්ෂේත්‍ර දෙකෙහිම නිලධාරීන් පුහුණු කිරීම තවදුරටත් සිදුවිය. ආර්ථික විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි අධ්‍යයනය සඳහා නිලධාරීන් පස්දෙනෙකු පිටරට යවනු ලැබීය. ප්‍රධාන වශයෙන්, ග්‍රාමීය, කෘෂි හා කාර්මික ණය ක්‍රම, බැංකු කටයුතු හා ආර්ථික විද්‍යාව යනාදී ක්ෂේත්‍රයන්ට අදාළ කෙටි කාලීන පුහුණු පාඨමාලා සඳහා නිලධාරීන් පණස් අටදෙනෙකු පිටරට යවන ලදී.

මේ අතරම, විශේෂයෙන් බැංකුවේ ග්‍රාමීය බැංකු හා මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලයේද පුහුණු කිරීම් කරනු ලැබීය. ශ්‍රී ලංකාවේ බැංකු කටයුතු හා මූල්‍ය අංශයේ පුද්ගලයන් පුහුණු කිරීමේ ප්‍රධාන ආයතනයක් බවට විද්‍යාලය පත්ව ඇති හෙයින්, මහ බැංකු නිලධාරීන්, මෙරට වෙනත් පුහුණු කිරීමේ ආයතනවලට, පුහුණුව සඳහා යැවීමේ අවශ්‍යතාවය අඩු විය. විද්‍යාලයේදී, නිලධාරීන් හැත්තෑ එක් දෙනෙක් පුහුණු වීමේ පාඨමාලාවලට සහභාගි වූහ. වාණිජ බැංකු සිද්ධාන්ත හා ක්‍රියාකාරිත්වය පිළිබඳ පාඨමාලාව, මහ බැංකු නිලධාරීන් සඳහා ලංකා බැංකුවේදී සහ මහජන බැංකුවේදී වර්ෂය තුළදී තවදුරටත් පවත්වාගෙන යන ලද අතර, එය 1984 දී ද නොකඩවා පවත්වනු ලැබේ.

**සම්මන්ත්‍රණ**

ග්‍රාමීය බැංකු සහ මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලය විසින් සංවිධානය කරන ලද සම්මන්ත්‍රණ වලට අමතරව, බැංකුව විසින් කාලීන වැදගත්කමකින් යුත් මාතෘකා යටතේ සම්මන්ත්‍රණ සංවිධානය කරන ලදී. මින් පළමුවැනි සම්මන්ත්‍රණය ' පොළී අනුපාතික ' මාතෘකා කොටගෙන කොළඹදී පවත්වන ලද අතර, ග්‍රාම සංවර්ධන කටයුතුවල නියැලුණු පුද්ගලයින් වැඩියෙන් සහභාගී කර ගැනීමේ අරමුණ ඇතිව, දෙවැන්න ' ග්‍රාමීය ණය සහ සංවර්ධනය ' යන මාතෘකාව යටතේ බදුල්ලේ දී පවත්වන ලදී. කෘෂිකර්මාන්තය, කර්මාන්ත සහ ස්වයං රැකියා ව්‍යාපෘති වල නියුක්ත වූවන්ට වාණිජ බැංකු විසින් ලබාදෙනු ලබන පහසුකම් පිළිබඳව අධ්‍යයනයක් ලබාදීම, මහ බැංකුවේ එකී ක්‍රියා පිළිවෙත ප්‍රචාරයට පත්කිරීම, ග්‍රාමීය ප්‍රදේශවල සිටින බැංකු නිලධාරීන්ට ග්‍රාමීය ණය නව උපනතීන් පිළිබඳව දැනීමක් ලබාදීම සහ මෙම ක්ෂේත්‍රයේ දත්ත අඛණ්ඩව එකතු කිරීම පහසුකර වීම, මෙකී සම්මන්ත්‍රණයේ පරමාර්ථය විය.

**අනුග්‍රාහක සේවා**

1981 වර්ෂය මැද දී ස්ථාපනය කරන ලද බැංකු කටයුතු පිළිබඳ අනුග්‍රාහක කමිටුව, පුළුල්වන ආර්ථිකයක් තුළ, වාණිජ බැංකු සේවා වැඩි දියුණු කිරීමේ පරමාර්ථය ප්‍රධාන තැන්හි තබා එද සිටම ක්‍රියාකාරී වෙමින් පවතී. එය, මහ බැංකුව, වාණිජ බැංකු, සංවර්ධනය පෙරදැරි කර ගත් සමහර අමාත්‍යාංශ හා රාජ්‍ය ආයතන යනාදියෙහි ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන් සමන්විතය. 1983 වර්ෂය තුළදී කමිටුව ප්‍රධාන වශයෙන්ම, චෙක්පත් හා විදේශීය අණකර මුදල් කිරීම හා ණය දීම ආදී බැංකු ගණුදෙනු ඉක්මන් කරවීමට අදළ කරුණු කෙරෙහි අවධානය යොමු කළේය. තවද, කමිටුව අපනයන ක්ෂේත්‍රයට බැංකු මූල්‍ය පහසුකම් සැපයීම පිළිබඳවද වෙන් වෙන් වශයෙන් සොයා බැලීය. ගණුදෙනුකරුවන්ට මෙන්ම බැංකුවලටද සහාය වනු පිණිස, බැංකුවල ප්‍රවෘත්ති සේවා පුළුල් කිරීමේ අවශ්‍යතාවය පිළිබඳවද කමිටුව සාකච්ඡා කළේය.

**වැඩ බලමුළුව**

1983 ජූලි මාසයේදී වෙළෙඳ හා කර්මාන්ත ව්‍යාපාරවලට සිදු වූ හානිය තක්සේරු කිරීම පිණිස, වැඩ බලමුළුවක් ගරු මුදල් ඇමතිතුමා විසින් පත් කරන ලදී. සංඛ්‍යාන අධ්‍යක්ෂගේ නායකත්වයෙන් යුක්ත වූ මෙම වැඩ බලමුළුව, මුදල් හා ක්‍රම සම්පාදන, කර්මාන්ත හා විද්‍යා කටයුතු, පේෂකර්මාන්ත, වෙළෙඳ හා නාවික, අමාත්‍යාංශවල හා මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන් සමන්විත විය. වැඩ බලමුළුවේ වාර්තාව 1983 අගෝස්තු 16 වැනි දින භාර දෙන ලදී.

**ප්‍රාදේශීය කාර්යාලය—මාතර**

ආරම්භයේදී නියමු යෝජනා ක්‍රම වශයෙන් හඳුන්වා දුන් සිය ග්‍රාමීය ණය සහ ප්‍රාදේශීය සංවර්ධන කටයුතු 1983 වර්ෂය තුළ ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලය විසින් තවදුරටත් ව්‍යාප්ත කිරීමෙහි යෙදුණි. මේ අනුව, ප්‍රාදේශීය කාර්යාලය මගින් ස්වයං රැකියා යෝජනා ක්‍රමය සහ ගම් නගා සිටුවීමේ යෝජනා ක්‍රමය ක්‍රියාශීලීව දිරිගන්වමින් ව්‍යාපෘති හඳුනා ගැනීමෙන් සහ පුහුණු කිරීමේ වැඩසටහන් පැවැත්වීමෙන් ප්‍රදේශයේ බැංකුවලට සහාය විය.

කුකුළන් ඇති කිරීම, කිරි හරකුන් ඇති කිරීම, ගෙවතු වගාව හා සුළු කර්මාන්ත වැනි ක්ෂේත්‍රයන් සඳහා බැංකු වලින් ණය ලබා ගැනීමට බලාපොරොත්තු වන අයට තාක්ෂණික හා කළමනාකාරිත්ව හැකියාවන් ලබා දීම අරමුණු කොටගෙන එකී පුහුණු කිරීමේ වැඩසටහන් පවත්වන ලදී. ප්‍රදේශයේ වෙළෙඳ බැංකු, රජයේ ආයතන හා අනෙකුත් අදළ නියෝජිතායතනවල සහයෝගීතාවයද ඇතිව මෙකී පුහුණු කිරීමේ වැඩසටහන් යටතේ පුහුණු වන්නන් 1,361 දෙනෙකු සහභාගී වූ පාඨමාලා 36 ක් සංවිධානය කරනු ලැබීය. මූලික පුහුණුවක් ලබා දීමට අමතරව ක්ෂේත්‍ර විමර්ෂණ කටයුතු හා සාර්ථක ආර්ථික ව්‍යාපෘතිවල අගැයීම් වාර්තා පිළියෙල කිරීමද ප්‍රාදේශීය කාර්යාලය මගින් සිදු කරන ලදී. එපමණක් නොව එම ව්‍යාපෘති සාර්ථකව ක්‍රියාත්මක කරවීමේ අටියෙන් මෙකී ණය ලබා ගැනීමට බලාපොරොත්තු වන අයට බැංකු වලින් ණය පහසුකම් ලබා ගැනීමට හා අනතුරුව සලසාලිය යුතු අලෙවි පහසුකම් වැනි සම්බන්ධිත සේවාවන් සපයා දීමටද සහාය විය. අවසාන වශයෙන්, ප්‍රාදේශීය කාර්යාලය මගින් වෙළෙඳ බැංකුවල සහායද ඇතිව ලබා ගත් ණය නියමිත ව්‍යාපෘති කටයුතු සඳහා වැය කිරීම අධීක්ෂණය කිරීමද, එම ණය ආපසු ගෙවීම සහතික කරවනු පිණිස පසු විපරම් කටයුතුද කරන ලදී.

ස්වයං රැකියා යෝජනා ක්‍රමය සඳහා ප්‍රතිමූල්‍ය පහසුකම් ලබා දීම ප්‍රධාන වශයෙන් සකස් කරන ලද්දේ දිස්ත්‍රික්කයේ රැකියා විරහිත තරුණ තරුණියන් ස්වයං රැකියා කටයුතුවල නිරත කරවීම දිරි ගන්වනු පිණිසය. 1983 අවසානය වනවිට ප්‍රාදේශීය කාර්යාලය විසින් මෙම යෝජනා ක්‍රමය යටතේ ව්‍යාපෘති 460 ක් වෙළෙඳ බැංකුවලට නිර්දේශ කර තිබුණි. මින් ව්‍යාපෘති 268 ක් සඳහා රු. 11,86,130 ක මුළු ණය මුදලක් ලබා දෙන ලදී. මෙකී ස්වයං රැකියා යෝජනා

ක්‍රමය යටතේ නිර්දේශ කරන ලද ව්‍යාපෘති වලින් හතරෙන් එකක් පමණ කුකුලන් ඇති කිරීම හා කිරි හරකුන් ඇති කිරීමද ඇතුළත් කෘෂිකාර්මික අංශයට අයත් වූ අතර ඉතිරි වැඩි කොටස අයත් වූයේ ගඩොල් නිෂ්පාදනය, කොහු කර්මාන්තය, රස කැවිලි හා ඇඟළුම් නිෂ්පාදනය වැනි කෘෂිකාර්මික නොවන කටයුතුවලටය.

ගම් නගා සිටුවීමේ යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිමූල්‍ය පහසුකම් සැලසීමේ පදනම වූයේ 'ඒකරාශිත ආකල්පය මත' ග්‍රාමීය ආදායම් මට්ටම සහ රැකියා උත්පාදනය වැඩි දියුණු කිරීමේ අරමුණෙන් ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධනය සඳහා මූල්‍ය පහසුකම් සැපයීමයි. මෙම ක්‍රමය යටතේ 1983 අවසානය වනවිට බැංකු විසින් ගම් පහක් තෝරාගෙන තිබුණි. මෙම යෝජනා ක්‍රමය සඳහා දී ඇති මුළු ණය ප්‍රමාණය සාපේක්ෂිකව සුළු වශයෙන් පෙනුනද, ගොවියන් හා ගම්වාසීන් සංවිධානය කිරීම, ගම්වාසීන් පුහුණු කිරීම, බැංකු කරුවන් හා ගම්වාසීන් අතර සම්බන්ධය දියුණු කිරීම ආදී කටයුතු අතින් ලබාගත් ප්‍රතිඵල සැලකියයුතු තරම් වේ.

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ ලංකා බැංකුව හා මහජන බැංකුව යන රාජ්‍ය බැංකු දෙකද, ඉන්දියානු ඕවර්සීස් බැංකුවද, මාතර ප්‍රාදේශීය කාර්යාලය විසින් නිර්දේශ කරන ලද ව්‍යාපෘති සඳහා මූල්‍ය පහසුකම් සැපයීමේ කටයුතුවල කාර්යශීලීව නිරත විය. ස්වයං රැකියා යෝජනා ක්‍රමය හා ගම් නගා සිටුවීමේ යෝජනා ක්‍රමය යටතේ ඇති ව්‍යාපෘතිවල ප්‍රගතිය පෙන්නුම් කරන සම්පිණ්ඩිත තොරතුරු 2.8 වැනි සංඛ්‍යා සටහනෙහි දැක්වේ. ඉහත යෝජනා ක්‍රම දෙක යටතේ නිර්දේශ කරන ලද ව්‍යාපෘතිවල මුළු සංඛ්‍යාව 503 කි. මෙයින් ව්‍යාපෘති 297 ක් සඳහා බැංකු විසින් රු. 12,81,115 ක මුදලක් ලබා දෙනු ලැබීය. 1983 දෙසැම්බර් අවසානය වනවිට මෙම ව්‍යාපෘති යටතේ උත්පාදනය කරන ලද මුළු රැකියා ප්‍රමාණය 523 ක් සේ ඇස්තමේන්තු කොට ඇත.

නිර්දේශ කරන ලද කාර්‍ය්‍යයන් උදෙසාම ණය මුදල් යොදවන බවට වග බලා ගැනීම සඳහා ගන්නා ලද සාර්ථක වැයමෙහි ප්‍රතිඵලයක් වශයෙන්, ඵල දැරීමේ කාලයට එළඹ සිටි ව්‍යාපෘති මඟින් කරන ලද ණය ආපසු ගෙවීමේ ප්‍රමාණය 1983 දෙසැම්බර් අවසානය වනවිට සියයට 78 ක් විය. මේ කාලය තුළදී ණය මුදල් කිපයක් සම්පූර්ණයෙන්ම ආපසු ගෙවීම් නිම කරන ලද අතර, එවැනි ණයකරුවන් කිප දෙනෙකුට ඔවුන්ගේ ව්‍යාපෘති සඳහා වැඩිපුර මූල්‍යාධාර ලබා දීමටද නිර්දේශ කරන ලදී. ණය ආපසු ගෙවීම් ප්‍රගතිය පෙන්වන 2.9 වැනි සංඛ්‍යා සටහනෙන් ණය ආපසු ලබා ගැනීමේ සාර්ථකත්වය පැහැදිලි වේ.

ග්‍රාමීය ජනතාව තුළ සාමූහික සහ සමූපකාරික ආකල්පයන් දියුණු කිරීම මඟින් ග්‍රාමීය ආර්ථික කටයුතු දිරි ගැන්වීමෙන් බැංකු ණය පහසුකම් ලබා ගැනීමේ පදනමක් සැලසෙන වැඩ පිළිවෙළක්ද ප්‍රාදේශීය කාර්යාලය මඟින් දියත් කරන ලදී. සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ එසේ සංවිධානය කරන ලද සාමූහික ආර්ථික කටයුතු අතර ගෙවතු වගාව, පශු පාලනය හා කුඩා කර්මාන්තද විය. මෙකී කාර්‍ය්‍යයෙහිදී ප්‍රදේශයේ ඇති ස්වෙච්ඡා හා රජයේ නොවන ආයතන කිහිපයක්ම සහාය විය. තවද, මෙම කටයුතු වලින් සමහරක් හම්බන්තොට සහ මොණරාගල යන දිස්ත්‍රික්කයන්ද ආවරණය වන පරිදි ව්‍යාප්ත කරන ලදී.

මහ බැංකු ප්‍රතිමූල්‍ය ක්‍රමය යටතේ වී වගාව සඳහා දෙනු ලබන ණය අනුමත කිරීම සහ මුදා හැරීම ඉක්මන් කිරීම සඳහා හඳුන්වා දෙන ලද ''ණය කඳවුරු'' ක්‍රමයෙහි සාර්ථකත්වය මත ප්‍රාදේශීය කාර්යාලය විසින් ආදර්ශ යාය වී වගා ණය යෝජනා ක්‍රමයක් මාතර දිස්ත්‍රික්කයේ ආරම්භ කරන ලදී. මෙහි පරමාර්ථය වූයේ තනි ගොවියා නොව '' යාය '' ඒකකයක් වශයෙන් ගෙන වගා කටයුතුවල නියැලි ගොවීන් ඒකරාශී කිරීමයි. මෙම සැලැස්මෙහි තවත් අරමුණක් වූයේ කෘෂිකර්මාන්තය සඳහා භාවිතා කරන ශිල්ප ක්‍රම වැඩි දියුණු කිරීමත්, සරල බැංකු ක්‍රම යොදා ගැනීමත් ''ගොවි සායනයන් '' යටතේ තාක්ෂණික සේවා ලබා දීමත්, ලබා ගත් ණය වඩා සාර්ථක ලෙස යෙදීම හා ණය ආපසු ලබා ගැනීමත්ය. 1983 යල කන්නයේදී සහ 1983/84 මහ කන්නයේදී දිස්ත්‍රික්කයේ ගම් හයක අක්කර 460 ක් වගා කරන ගොවීන් 260 දෙනෙකුට රු. 3,04,940 ක ණය මුදල් මෙම ක්‍රමය යටතේ ලබා දෙන ලදී.

## 2.8 සංඛ්‍යා සටහන

### 1983 දෙසැම්බර් මස අවසානයට මාතර ප්‍රාදේශීය කාර්යාලය මගින් අනුමත කරන ලද ස්වයං රැකියා යෝජනා ක්‍රමය සහ ගම් නගා සිටුවීමේ යෝජනා ක්‍රමය යටතේ ඇති ව්‍යාපෘති වල ප්‍රගතිය

| අංශය | ස්වයං රැකියා යෝජනා ක්‍රමය | | | | ගම් නගා සිටුවීමේ යෝජනා ක්‍රමය | | | | මුළු එකතුව | | | | ඇතිකරනලද රැකියා ප්‍රමාණය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | නිර්දේශිත මුළු එකතුව | | අනුමත මුළු එකතුව | | නිර්දේශිත මුළු එකතුව | | අනුමත මුළු එකතුව | | නිර්දේශිත මුළු එකතුව | | අනුමත මුළු එකතුව | | |
| | සංඛ්‍යාව | ප්‍රමාණය (රු.) | සංඛ්‍යාව | ප්‍රමාණය (රු.) | සංඛ්‍යාව | ප්‍රමාණය (රු.) | සංඛ්‍යාව | ප්‍රමාණය (රු.) | සංඛ්‍යාව | ප්‍රමාණය (රු.) | සංඛ්‍යාව | ප්‍රමාණය (රු.) | |
| **කෘෂිකර්මාන්තය** | | | | | | | | | | | | | |
| 1. කෘෂිකර්මාන්තය .. .. | 18 | 65,865 | 7 | 26,285 | 3 | 5,000 | — | — | 21 | 70,865 | 7 | 26,285 | 10 |
| 2. කිරිහරකුන් ඇතිකිරීම .. | 28 | 123,700 | 9 | 42,500 | 4 | 19,800 | 3 | 14,400 | 32 | 143,500 | 12 | 56,900 | 12 |
| 3. කුකුළන් ඇතිකිරීම .. .. | 79 | 418,800 | 41 | 214,200 | 2 | 20,000 | 2 | 20,000 | 81 | 438,800 | 43 | 234,200 | 43 |
| 4. එළුවන් ඇතිකිරීම .. .. | 2 | 6,000 | — | — | 5 | 11,500 | 5 | 11,500 | 7 | 17,500 | 5 | 11,500 | 5 |
| 5. ධීවර කර්මාන්තය .. .. | 4 | 18,450 | 3 | 11,000 | — | — | — | — | 4 | 18,450 | 3 | 11,000 | 3 |
| **කර්මාන්ත** | | | | | | | | | | | | | |
| 6. බේකරි සහ රස කැවිලි .. | 27 | 108,620 | 17 | 71,140 | 2 | 7,125 | 1 | 5,000 | 29 | 115,745 | 18 | 76,140 | 36 |
| 7. අනෙකුත් ආහාර නිෂ්පාදිත .. | — | — | — | — | — | — | — | — | — | — | — | — | — |
| 8. දුම්කොල/බීඩි .. .. | 6 | 28,785 | 3 | 16,200 | — | — | — | — | 6 | 28,785 | 3 | 16,200 | 10 |
| 9. අත්යන්ත්‍ර රෙදිපිළි .. .. | 11 | 40,550 | 8 | 30,050 | 4 | 12,500 | 3 | 7,500 | 15 | 53,050 | 11 | 37,550 | 27 |
| 10. ඇඳුම් මැසීම .. .. | 39 | 159,915 | 31 | 126,515 | — | — | — | — | 39 | 159,915 | 31 | 126,515 | 58 |
| 11. අනෙකුත් රෙදිපිළි කර්ම නිෂ්පාදිත .. | 14 | 52,570 | 9 | 36,370 | — | — | — | — | 14 | 52,570 | 9 | 36,370 | 21 |
| 12. වඩු වැඩ .. .. | 25 | 93,570 | 12 | 50,220 | — | — | — | — | 25 | 93,570 | 12 | 50,220 | 18 |
| 13. කඩදාසි නිෂ්පාදිත .. | 5 | 23,890 | 1 | 4,090 | — | — | — | — | 5 | 23,890 | 1 | 4,090 | 2 |
| 14. ලෝහ නොවන ඛනිජ .. | 78 | 306,555 | 46 | 180,825 | 5 | 18,575 | — | — | 83 | 325,130 | 46 | 180,825 | 135 |
| 15. කළුගල් කැඩීම .. .. | 9 | 36,215 | 5 | 21,500 | 2 | 5,471 | 2 | 5,250 | 11 | 41,686 | 7 | 26,750 | 19 |
| 16. ලෝහ නිෂ්පාදිත .. | 10 | 46,200 | 9 | 41,200 | — | — | — | — | 10 | 46,200 | 9 | 41,200 | 26 |
| 17. කොහු නිෂ්පාදිත .. .. | 31 | 80,480 | 21 | 55,260 | 9 | 17,710 | 8 | 15,915 | 40 | 98,190 | 29 | 71,175 | 35 |
| 18. අලුත්වැඩියා සහ නඩත්තු කිරීම .. | 28 | 119,675 | 14 | 58,195 | — | — | — | — | 28 | 119,675 | 14 | 58,195 | 19 |
| 19. අනෙකුත් .. .. | 23 | 92,815 | 15 | 62,630 | 4 | 16,120 | 2 | 6,120 | 27 | 108,935 | 17 | 68,750 | 23 |
| 20. ගොවි උපකරණ .. | 3 | 83,750 | 3 | 83,750 | 3 | 9,300 | 3 | 9,300 | 6 | 93,050 | 6 | 93,050 | 7 |
| 21. රසායනික ද්‍රව්‍ය .. .. | 6 | 24,800 | 5 | 20,800 | — | — | — | — | 6 | 24,800 | 5 | 20,800 | 5 |
| 22. වෙළෙඳ හා වාණිජ කටයුතු .. | 14 | 54,400 | 9 | 33,400 | — | — | — | — | 14 | 54,400 | 9 | 33,400 | 9 |
| එකතුව .. | 460 | 1,985,605 | 268 | 1,186,130 | 43 | 143,101 | 29 | 94,985 | 503 | 2,128,706 | 297 | 1,281,115 | 523 |

මූලයන් : මාතර ප්‍රාදේශීය කාර්යාලය,
ශ්‍රී ලංකා මහ බැංකුව.

**2.9 සංඛ්‍යා සටහන**

**ශ්‍රී ලංකා මහ බැංකුව—මාතර**

**1983 දෙසැම්බර් මස අවසානයට ණය ආපසු ගෙවීමේ තත්ත්වය**

| අංශය | ප්‍රාග්ධන ණය ආපසු ගෙවීම් | | | |
|---|---|---|---|---|
| | නිකුත් කරන ලද ණය ප්‍රමාණය | ලැබිය යුතු | ගෙවා නිමි | කල් ඉකුත් වූ |
| **කෘෂිකර්මාන්ත** | | | | |
| 1. කෘෂිකර්මාන්තය .. .. | 20,800 | 7,060 | 6,352 | 708 |
| 2. කිරි හරකුන් ඇතිකිරීම .. | 20,400 | 4,080 | 2,880 | 1,200 |
| 3. කුකුළන් ඇතිකිරීම .. .. | 122,315 | 40,301 | 29,019 | 11,282 |
| 4. එළුවන් ඇතිකිරීම .. .. | — | — | — | — |
| 5. ධීවර කර්මාන්තය .. .. | 3,000 | 2,850 | 1,350 | 1,500 |
| **කර්මාන්ත** | | | | |
| 6. බේකරි සහ රස කැවිලි .. | 44,349 | 28,662 | 22,334 | 6,328 |
| 7. අනෙකුත් ආහාර නිෂ්පාදිත .. | — | — | — | — |
| 8. දුම්කොළ/බීඩි .. .. | 16,200 | 10,192 | 3,260 | 6,932 |
| 9. අත්යන්ත්‍ර රෙදිපිළි .. .. | 25,300 | 9,393 | 7,308 | 2,085 |
| 10. ඇඳුම් මැසීම .. .. | 98,115 | 54,161 | 41,823 | 12,338 |
| 11. අනෙකුත් පේෂකර්ම නිෂ්පාදක .. | 29,070 | 17,886 | 13,691 | 4,195 |
| 12. වඩු වැඩ .. .. | 48,220 | 19,729 | 17,902 | 1,827 |
| 13. කඩදාසි නිෂ්පාදිත .. .. | 4,090 | 2,622 | 2,394 | 228 |
| 14. ලෝහ නොවන ඛනිජ .. | 140,900 | 96,018 | 75,757 | 20,261 |
| 15. කළුගල් කැඩීම .. .. | 25,250 | 12,795 | 11,595 | 1,200 |
| 16. ලෝහ නිෂ්පාදිත .. .. | 26,300 | 12,345 | 10,115 | 2,230 |
| 17. කොහු නිෂ්පාදිත .. .. | 57,235 | 26,392 | 22,691 | 3,701 |
| 18. අලුත්වැඩියා සහ නඩත්තු කිරීම් .. | 40,100 | 21,320 | 17,005 | 4,315 |
| 19. අනෙකුත් .. .. | 43,150 | 22,319 | 17,244 | 5,075 |
| 20. ගොවි උපකරණ .. .. | 90,750 | 10,450 | 10,273 | 177 |
| 21. රසායනික ද්‍රව්‍ය .. .. | 15,800 | 7,255 | 4,215 | 3,040 |
| 22. වෙළෙඳ හා වාණිජ කටයුතු .. | 7,400 | 3,764 | 3,008 | 756 |
| එකතුව .. | 878,744 | 409,594 | 320,216 | 89,378 |

ප්‍රාදේශීය කාර්යාලයේ උපදෙස් ඇතිව ඉන්දියානු ඕවර්සීස් බැංකුව විසින් කුකුළන් ඇති කිරීම, පොල් වගා කිරීම හා තේ නැවත වගා කිරීම, උක් වැවීම හා රෝද දෙකේ ට්‍රැක්ටර් මිළදී ගැනීම වැනි කටයුතු සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිමූල්‍ය පහසුකම් සහිත ප්‍රාදේශීය ණය සැළසුම් කීපයක් හඳුන්වා දෙන ලදී. එසේම මහ බැංකුවේ ප්‍රතිමූල්‍ය පහසුකම් ඇතිව, කුඩා තේ වතු හිමියන්ට පොහොර ලබා ගැනීම සඳහා ප්‍රාදේශීය ණය සැලැස්මක් මහජන බැංකුව සහ ලංකා බැංකුව මගින් ක්‍රියාත්මක කරන්නට යෙදුනි.

මාතර ප්‍රාදේශීය කාර්යාලය මගින් ප්‍රදේශයේ ඇති වෙළෙඳ බැංකු හතරක සහභාගිත්ව-යෙන් දිනකට නිෂ්කාශන දෙකක් පවත්වනු ලබන ප්‍රාදේශීය නිෂ්කාශනාගාරය මගින් 1983 වර්ෂය තුළ සිදු කරන ලද ගණුදෙනු ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 821 ක් විය.

**ප්‍රාදේශීය කාර්යාලය—අනුරාධපුරය**

1983 වර්ෂය, අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලයේ දෙවැනි ක්‍රියාකාරී වර්ෂය විය. අනුරාධ-පුරය දිවයිනේ විශාලතම දිස්ත්‍රික්කය වන බැවින් ප්‍රාදේශීය කාර්යාලයේ කටයුතු තවමත් දිස්ත්‍රික්කයටම සීමාවී පවතී. පොලොන්නරුව, ත්‍රිකුණාමලය හා පුත්තලම වැනි වෙනත් දිස්ත්‍රික්ක වල බැංකු හා වෙනත් ආයතනවලින් ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවාවන් ලබාගැනීම සඳහා කෙරෙන ඉල්ලීම් අනුව නුදුරු අනාගතයේදීම ආසන්න දිස්ත්‍රික්ක ආවරණය කිරීම සඳහා ප්‍රාදේශීය කාර්යාලයීය කටයුතු ව්‍යාප්ත කිරීමට බලාපොරොත්තු වනු ලැබේ.

දිස්ත්‍රික්කයේ සංවර්ධන හා කෘෂිකාර්මික ණය අධීක්ෂණයට අමතරව, ප්‍රාදේශීය කාර්යාලයේ ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රමයෙහි කටයුතු සමාලෝචනයට ලක්වූ වර්ෂය තුළදීත් නොකඩවාම පැවැතිණි. දිස්ත්‍රික්කයෙහි ඒ දක්වා බැංකු ක්‍රමය ව්‍යාප්ත නොවූ ප්‍රදේශවල සුළු පරිමාණ ව්‍යාපෘති සඳහා සංවර්ධන මූල්‍ය පහසුකම් වේගවත් කිරීමේ පියවරක් වශයෙන් 1982 වර්ෂයේදී මෙම ණය ක්‍රමය හඳුන්වා දෙනු ලැබිණි. මෙම ණය යෝජනා ක්‍රමය දිගු කාලයේදී ගැමි කොටස්වලට වඩ වඩා බැංකු පහසුකම් යොමු කරවා ගැනීමේ බලාපොරොත්තුවෙන් යුතුව, ග්‍රාමීය මහජනතාව හා ආණ්ඩුවේ ආයතනත්-බැංකු කරුවාත් අතර නොනවත්වා කෙරෙන සමීපස්ථ සංවාදයකට යෝග්‍ය පදනමක් ද සපයාදී ඇත. යෝජනා ක්‍රමයෙන් ආවරණය වන ප්‍රදේශය පුළුල් කිරීමේදී, ආරම්භක වර්ෂයේදී උප දිසාපති කොට්ඨාශ හයකට පමණක් සීමාවී තිබූ එහි කටයුතු 1983 දී උප දිසාපති කොට්ඨාශ 20 ක් සහිත මුළු දිස්ත්‍රික්කයටම ව්‍යාප්ත කරන ලදී. මෙම යෝජනා ක්‍රමය යටතේ පහසුකම් බලාපොරොත්තුවූ අයදුම්කරුවන් හඳුනාගන්නා ලද්දේ, ප්‍රාදේශීය උප දිසාපතිවරු, ග්‍රාමීය සංවර්ධන කටයුතු වල නියැලී සිටින ස්වේච්ඡාමය හා ආණ්ඩුවේ ආයතන සහ ග්‍රාමීය නිලධාරීන්ගේද සහයෝගය ඇතිව පවත්වන ලද සමූහ සාකච්ඡා, පෞද්ගලික මුණගැසීම් සහ ව්‍යාපෘති ස්ථාන පිරික්සා බැලීම් ඇතුළු ක්‍රියාවලියක් තුළිනි.

දිස්ත්‍රික්කයෙහි ප්‍රධානතම ආර්ථික කටයුත්ත කෘෂිකර්මය වන හෙයින් හා යල කන්නයේ වගාවන් සඳහා භූගත ජලය උපයෝගී කරගැනීමේ උත්සාහයක් වශයෙන්ද, ව්‍යාපෘතීන් තෝරා ගැනීමේදී, උස්සාන වාරි ක්‍රම යටතේ කෙරෙන කෘෂිකාර්මික ව්‍යාපෘති වලට ප්‍රමුඛත්වය දෙනු ලැබිණි. ව්‍යාපෘතීන් තෝරාගැනීමේදී සත්ව සම්පත් සංවර්ධනය විෂය කරගත් කටයුතුද වැදගත් අංශයක් වශයෙන් සැළකිණි. නිර්දේශ කරන ලද මුළු ව්‍යාපෘතීන්ගෙන් සියයට 83ක්ම කෘෂිකාර්මික හා සත්වපාලන අංශයට අයත් විය. තෝරා ගන්නා ලද සියලුම පුද්ගලයන්ට අදළ ක්ෂේත්‍රය පිළිබඳ මනා පුහුණුවක් ලබාදෙන ලදී.

1983 වර්ෂය අවසාන වනවිට මෙම යෝජනා ක්‍රමය යටතේ රුපියල් දශ ලක්ෂ 3.5 ක ණය පහසුකම් සලසනු පිණිස ව්‍යාපෘතීන් 637 ක් ලංකා බැංකුව, මහජන බැංකුව, හැටන් නැෂනල් බැංකුව හා ඉන්දියානු රාජ්‍ය බැංකුව යන බැංකු වෙත යොමුකොට තිබුණි. විස්තර 2.10 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

1983 දෙසැම්බර් අවසානය වනවිට ව්‍යාපෘතීන් 186 ක් සඳහා ලංකා බැංකුව හා මහජන බැංකුව ඒකාබද්ධිතව රුපියල් දශ ලක්ෂ 1 ක් අනුමත කොට තිබුණි. සමාලෝචනයට ලක්වූ වසර තුළදී, අනුමත කරන ලද මුළු මුදලින් ව්‍යාපෘතීන් 128 ක් සඳහා රුපියල් 7,24,125 ක් මුදා හැර තිබුණි.

මූල්‍යකරණය කරන ලද ඒකකයන්හි ස්ථාවර ප්‍රගතිය සුරැකීමේ අදහසින්, පුහුණු පාඨමාලාවන්ට අමතරව ප්‍රාදේශීය කාර්යාලය මගින් ව්‍යාප්ති සේවා පහසුකම්, නිරන්තර මග පෙන්වීම්, ක්‍රියාකාරී හා පරිපාලනාත්මක අංශයන්ට අදළ උපදෙස් ආදිය සැපයීමද නොකඩවාම කරගෙන යන ලදී.

ආරම්භ කරන ලද ව්‍යාපෘතීන්ගෙන් පුද්ගලයන් 91 දෙනෙකුට නව රැකියා අවස්ථාවන් සැපැයුණු අතර, 78 දෙනෙකුට පූර්ණ සේවා නියුක්තිය සැළැසුණි. ආරම්භ කරන ලද ව්‍යාපෘතීන්ගෙන් ජනිත වූ දළ පිරිවැටුම රුපියල් දශ ලක්ෂ 5.3 යයි ඇස්තමේන්තු කර ඇත.

මූල්‍යකරණය කරන ලද ව්‍යාපෘතීන්ගෙන් 62 ක් බැංකු ණය වාරික ගෙවීම ආරම්භ කරන ලදී. බැංකුවලට ගෙවිය යුතු වූ මුළු ප්‍රමාණයෙන් සියයට 87 ක් පමණ ණයකරුවන් විසින් බේරුම්කර තිබුණි.

## 2 . 10 සංඛ්‍යා සටහන

## ගම් නගා සිටුවීමේ හා ස්වයං රැකියා යෝජනා ක්‍රමය (1983 දෙසැම්බර් අවසානය දක්වා)

(වටිනාකම රුපියල් දහස්)

| වර්ගය | බැංකු වෙත ඉදිරිපත් කළ ව්‍යාපෘති සංඛ්‍යාව | | බැංකු විසින් අනුමත කළ ව්‍යාපෘතීන් සංඛ්‍යාව | | මුල්‍යකරණය කරන ලද ව්‍යාපෘති | | | | | ණය ආපසු ගෙවීම | | | | සේවා නියුක්තිය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | ප්‍රාග්ධන සංයෝජනය | | | | ඇස්තමේන්තුගත දළ පිරිවැටුම | ණය ආපසු ගෙවිය යුතු ව්‍යාපෘති සංඛ්‍යාව | දෙසැ: අවසානය වනවිට ගෙවීමට තිබූ මුළු මුදල | දෙසැම්බර් අවසානයේදී ගෙවන ලද මුළු මුදල | නොගෙවා තිබූ මුළු මුදල | |
| | ඒකක | වටිනාකම | ඒකක | වටිනාකම | ඒකක | බැංකු ණය මුදල | ණය කරුගේ දයකත්වය | එකතුව | | | | | | |
| **1. උස්සාන වාරික්‍රම යටතේ කෘෂිකර්මය** | | | | | | | | | | | | | | |
| 1·1 විවෘත ළිඳ සහ ජල ඉසින යන්ත්‍රය | 160 | 1,330.6 | 45 | 389.5 | 37 | 314.7 | 76.1 | 390.8 | 1,225.0 | 06 | 2.9 | 2.1 | 0.8 | 48 |
| 1·2 කෙසෙල් වගාව | 02 | 9.8 | 01 | 3.5 | — | — | — | — | — | — | — | — | — | — |
| 1·3 සුළංබල යන්ත්‍රය | 05 | 67.3 | — | — | — | — | — | — | — | — | — | — | — | — |
| **2. සත්ව පාලනය** | | | | | | | | | | | | | | |
| 2·1 කුකුල් පාලනය | 77 | 474.1 | 25 | 149.6 | 18 | 96.0 | 32.1 | 128.1 | 413.9 | 09 | 5.1 | 2.9 | 2.2 | 18 |
| 2·2 කිරිපට්ටි පාලනය | 89 | 480.6 | 16 | 81.8 | 01 | 5.4 | 0.9 | 6.4 | — | — | — | — | — | 01 |
| 2·3 එළුවන් පාලනය | 124 | 430.4 | 30 | 104.2 | 14 | 49.3 | 7.0 | 56.3 | — | 01 | 0.7 | 0.7 | — | 14 |
| 2·4 ඌරු පාලනය | 76 | 239.7 | 17 | 65.9 | 11 | 46.3 | 16.0 | 62.3 | — | — | — | — | — | 11 |
| **3. කර්මාන්ත** | | | | | | | | | | | | | | |
| 3·1 ගඩොල් නිෂ්පාදනය | 11 | 46.3 | 05 | 22.8 | 02 | 9.5 | 1.6 | 11.1 | 116.2 | 02 | 2.6 | 2.0 | 0.6 | 04 |
| 3·2 බේකරි සහ රසකැවිලි | 21 | 103.0 | 15 | 70.9 | 15 | 70.9 | 31.4 | 102.3 | 2,150.5 | 15 | 25.0 | 22.4 | 2.6 | 26 |
| 3·3 කම්මල්, ටින්කර් වැඩ සහ ට්‍රැක්ටර් නඩත්තුව | 11 | 60.8 | 02 | 8.1 | 02 | 8.1 | 2.4 | 10.5 | 135.1 | 02 | 3.2 | 3.2 | — | 03 |
| 3·4 වඩුවැඩ හා ලී කැටයම් | 13 | 81.0 | 08 | 45.1 | 07 | 40.2 | 15.0 | 55.2 | 481.7 | 06 | 10.5 | 8.9 | 1.6 | 08 |
| 3.5 බීඩි හා සුරුට්ටු නිෂ්පාදනය | 02 | 8.9 | 02 | 8.9 | 02 | 8.9 | 2.1 | 11.0 | 124.9 | 02 | 2.9 | 2.6 | 0.4 | 12 |
| 3·6 රෙදිපිළි නිෂ්පාදන හා බතික් | 07 | 31.5 | 04 | 15.5 | 04 | 15.5 | 6.6 | 22.1 | 171.2 | 04 | 6.1 | 5.8 | 0.3 | 05 |
| 3·7 කොහු නිෂ්පාදනය | 05 | 20.0 | 02 | 7.8 | 02 | 7.8 | 0.9 | 8.7 | 90.0 | 02 | 3.4 | 3.1 | 0.4 | 03 |
| 3·8 ලිපි කවර හා සබන් නිෂ්පාදනය | 02 | 9.3 | 01 | 5.5 | 01 | 5.5 | 1.2 | 6.7 | 80·6 | 01 | 2.5 | 2.5 | — | 02 |
| 3·9 ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය | 01 | 3.0 | — | — | — | — | — | — | — | — | — | — | — | — |
| **4. සේවා** | | | | | | | | | | | | | | |
| 4·1 වෙළඳාම් සහ ඇඟුරුම් | 08 | 30.0 | 03 | 8.0 | 03 | 8.0 | 1.4 | 9.4 | 79.8 | 03 | 3.0 | 2.8 | 0.2 | 03 |
| 4·2 පාපැදි අලුත්වැඩියාව | 13 | 48.5 | 07 | 25.5 | 06 | 22.5 | 10.8 | 33.3 | 163.9 | 06 | 3.7 | 3.4 | 0.2 | 06 |
| 4·3 ඡායාරූප ශිල්පය | 02 | 15.0 | 01 | 8.5 | 01 | 8.5 | 5.0 | 13.5 | 57.6 | 01 | 2.5 | 2.5 | — | 02 |
| 4·4 බාබර් වැඩ | 04 | 9.9 | 01 | 3.0 | 01 | 3.0 | 1.6 | 4.6 | 24.0 | 01 | 1.9 | 1.5 | 0.4 | 02 |
| 4·5 විදුලි භාණ්ඩ අලුත් වැඩියාව | 01 | 10.0 | — | — | — | — | — | — | — | — | — | — | — | — |
| 4·6 බැටරි යළි පිරවීම | 01 | 4.0 | 01 | 4.0 | 01 | 4.0 | 1.0 | 5.0 | 7.2 | 01 | 0.9 | 0.9 | — | 01 |
| 4·7 ප්‍රවාහන සේවා | 01 | 2.0 | — | — | — | — | — | — | — | — | — | — | — | — |
| 4·8 නාම පුවරු ඇඳීම | 01 | 5.0 | — | — | — | — | — | — | — | — | — | — | — | — |
| | 637 | 3,521.3 | 186 | 1,028.1 | 128 | 724.1 | 213.0 | 937.2 | 5,321.6 | 62 | 77.1 | 67.5 | 9.6 | 169 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

දිගු හා මධ්‍යකාලීන ව්‍යාපෘති මූල්‍යකරණයට අමතරව හොරොව්පතාන උප දිසාපති කොට්ඨාශය තුළ පිහිටි ගලහිටියාගම නමැති ඉතා දුරස්ථ නොදියුණු ගම්මානයෙක වගා ණය ව්‍යාපෘතියක්ද ක්‍රියාවට නංවනු ලැබිණි. මෙම ව්‍යාපෘතිය යටතේ හොරොව්පතාන ලංකා බැංකු ශාඛාව විසින් රුපියල් 74,440 ක් මුදහරින ලදී. අනාගතයේදී ව්‍යාපෘති මූල්‍යකරණය මගින් ඒකාබද්ධිත සංවර්ධන ක්‍රියාමාර්ගයක් අනුගමනය කිරීමේ බලාපොරොත්තුවෙන් යුතුව මෙම වගා ණය ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවිණි.

මීට අමතරව, සමාලෝචනයට ලක්වන කාලය තුළදී ප්‍රාදේශීය කාර්යාලය, එහි කටයුතු සමූපකාර ග්‍රාමීය බැංකු අධීක්ෂණය, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත (සුමක) පරීක්ෂා කිරීම, දීප ව්‍යාප්ත දත්ත රැස්කිරීමේ යෝජනා ක්‍රමය යටතේ පරිභෝජන හා නිෂ්පාදන මිළ ගණන් රැස්කිරීම වැනි ක්ෂේත්‍රයන්ටද පුළුල් කරන ලදී.

ග්‍රාමීය ණය දෙපාර්තමේන්තුවේ මගපෙන්වීම යටතේ ප්‍රාදේශීය කාර්යාලයේ කාර්ය මණ්ඩලය විසින් කුලියාපිටිය සමූපකාර ග්‍රාමීය බැංකුවේ ණය ගණු–දෙනු පරීක්ෂා කරනු ලැබිණි. ග්‍රාමීය ණය දෙපාර්තමේන්තුවේ හා ප්‍රාදේශීය කාර්යාලයේ කාර්ය මණ්ඩලයන් ඒකාබද්ධිතව බකමූණ සමූපකාර ග්‍රාමීය බැංකුවේ කටයුතු විභාග කරන ලදී.

දත්ත රැස්කිරීම සඳහා පත්කොට ඇති පුද්ගලයන් අධීක්ෂණය කරන අතර, පරිභෝජන භාණ්ඩ වල සිල්ලර මිළ සහ ප්‍රධාන කෘෂි නිෂ්පාදකයන්ගේ නිෂ්පාදන මිළ ආදිය ප්‍රාදේශීය කාර්යාලය විසින් ස්වාධීන පදනමක් යටතේ නොකඩවාම රැස් කරයි. මේ අතර, අතිරේක භෝග වර්ග නිෂ්පාදනය, නගරයේ සංචාරක පැමිණීම් යනාදිය සහ ප්‍රදේශයෙහි සුළු කාර්මික ව්‍යාපෘති වැනි අනෙකුත් වැදගත් අංශයන්හි ආර්ථික දත්ත රැස්කිරීම නොකඩවා කරනු ලැබේ.

ප්‍රදේශයෙහි සුමක ව්‍යාපෘති අධීක්ෂණය දැන් ප්‍රාදේශීය කාර්යාලයට පවරා ඇත. සමාලෝචනයට ලක්වූ කාලසීමාව තුළදී එවැනි ව්‍යාපෘති 13 ක් අධීක්ෂණයට ලක් කෙරිණි. ඒවා–යෙහි මතුවී ඇති ගැටළු හඳුනාගැනීම, ව්‍යාපෘතීන්හි වේගවත් ප්‍රගතිය හා ණය වාරික ආපසු අයවීමද සහතික කරලීම වැනි පරමාර්ථයන්ගෙන් යුතුව සුමක අධීක්ෂණ කටයුතු කරනු ලැබේ.

දෛනික නිෂ්කාශනයන් දෙකක් සහිතව ප්‍රාදේශීය කාර්යාලයෙහි නිෂ්කාශනාගාරයෙහි කටයුතුද නොකඩවාම කෙරිණි. නිෂ්කාශනය සඳහා ලංකා බැංකුව, මහජන බැංකුව, හැටන් නැෂනල් බැංකුව සහ ඉන්දියානු රාජ්‍ය බැංකුව සහභාගි වෙයි.

**විනිමය පාලන**

විනිමය පාලනය ක්‍රියාත්මක කිරීම පිළිබඳව බැංකුව තවදුරටත් රජයේ නියෝජිත වශයෙන් ක්‍රියාකරන්නට යෙදුණි. විමර්ශනයට අදාළ වර්ෂය තුළදී ක්‍රියාත්මක වූ විනිමය පාලන ක්‍රියා-පිළිවෙත්වල ප්‍රධාන වෙනස්කම් පහත දක්වා ඇත.

(1) නැව් හා ගුවන්සේවා බාහිර ගිණුම් :

ගුවන්සේවා බාහිර ගිණුම්වල බැරට ඇති ගමන් ගාස්තු හා ගැල්කුලී ප්‍රේෂණය කිරීම සඳහා 1983 ජනවාරි 1 වැනි දින සිට ක්‍රියාත්මකවන පරිදි විනිමය පාලකගේ අනුමැතිය අවශ්‍ය බව ප්‍රකාශයට පත් කරන ලදී.

(2) අපනයන :

(i) කරාබු නැටි සඳහා වූ පදනම් මිළ ක්‍රමය 1983 පෙබරවාරි 1 වැනි දින සිට ක්‍රියාත්මකවන පරිදි ඉවත් කරන ලදී.

(ii) කුරුඳු පොතු හෝ කුරු අපනයනය සඳහා 1983 මැයි 31 වැනි දින සිට ක්‍රියාත්මකවන පරිදි ආනයන හා අපනයන පාලක විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් අවශ්‍ය බව ප්‍රකාශයට පත්කරන ලදී.

(iii) කුරුඳු සඳහා වූ පදනම් මිළ ක්‍රමය 1983 සැප්තැම්බර් 16 වැනි දින සිට ක්‍රියාත්මකවන පරිදි අත්හිටුවන ලදී.

(3) අධ්‍යාපන :

පිටරට අධ්‍යාපනය සඳහා යන ශ්‍රී ලාංකිකයන්ගේ ජීවන වියදම් සඳහා මුදාහරිනු ලබන විනිමය ප්‍රමාණය පහත සඳහන් අන්දමට වැඩි කරන ලදී.

| රට | ජීවන වියදම් දීමනාව<br>උපාධි අපේක්ෂකයන්, වෘත්තීය හෝ කාර්මික අධ්‍යාපනය | පශ්චාත් උපාධි අධ්‍යාපනය |
|---|---|---|
| (අ) බංගලා දේශය, බුරුමය, ඉන්දියාව, මාලදිවයින, නේපාලය හා පකිස්ථානය | වර්ෂයකට ඉන්දියානු රු. 7,200 | වර්ෂයකට ඉන්දියානු රු. 9,600 |
| (ආ) එක්සත් රාජධානිය හා එ.සො.ස.ස. ආණ්ඩුව ඇතුළු යුරෝපීය රටවල් | වර්ෂයකට පවුම් 2,400 | වර්ෂයකට පවුම් 3,000 |
| (ඇ) ඕස්ට්‍රේලියාව, කැනඩාව, ජපානය, නවසීලන්තය සහ ඇමෙරිකා එක්සත් ජනපදය | වර්ෂයකට ඇමෙරිකානු ඩොලර් 6,000 | වර්ෂයකට ඇමෙරිකානු ඩොලර් 7,200 |
| (ඈ) අනෙකුත් රටවල් ... ... | වර්ෂයකට ඇමෙරිකානු ඩොලර් 3,600 | වර්ෂයකට ඇමෙරිකානු ඩොලර් 4,800 |

එසේම අවුරුදු 4 කට වරක් අනුමත කළ හැකි ඇඳුම් පැළඳුම් දීමනාව පවුම් 75 සිට 150 දක්වා වැඩි කරන ලදී.

(4) ඉන්දියානුවන් ආපසු යැවීම :

ඉන්දියාවට ආපසු යැමට අදහස් කරන ඉන්දියානුවන් සඳහා දෙනු ලබන විනිමය දීමනාව වැඩිහිටි අයෙකුට ශ්‍රී ලංකා රුපියල් 50 සිට ශ්‍රී ලංකා රුපියල් 100 දක්වාත් වයස අවුරුදු 12 න් පහළ ළමයෙකුට ශ්‍රී ලංකා රුපියල් 25 සිට ශ්‍රී ලංකා රුපියල් 50 දක්වාත් වැඩි කරන ලදී.

(5) සංචාරක චෙක්පත් මුදල් කිරීම :

එක් දිනයකදී පුද්ගලයෙකු විසින් මුදල් කළ හැකි සංචාරක චෙක්පත්වල වටිනාකම රු. 1,00,000 කට සීමා කරන ලදී.

(6) ආනයන :

(i) කෝපි ආනයනය කිරීම සඳහා ණයවර ලිපි විවෘත කිරීමේ දී වාණිජ අධ්‍යක්ෂකගේ පූර්ව අනුමැතිය අවශ්‍ය බව ප්‍රකාශයට පත් කරන ලදී.

(ii) කරාබු නැටි ආනයනය කිරීම සඳහා ණයවර ලිපි විවෘත නොකළ යුතු බව බලය ලත් වෙළඳුන් වෙත දන්වන ලදී.

(7) නේවාසික ජංගම ගිණුම් :

ශ්‍රී ලංකා රජය හෝ පෞද්ගලික ආයතනයක් සමග කොන්ත්‍රාත්තු වලට බැඳී සිටින විදේශීය සමාගම් හා පුද්ගලයන් විසින් පවත්වාගෙන යනු ලබන නේවාසික ජංගම ගිණුම් වලට කරනු ලබන හර කිරීම් මෙරට සිදුකරන වියදම් සඳහා විය යුතු අතර, එතෙර යවනු ලබන ප්‍රේෂණයන් කළ යුත්තේ එතෙර සිටින යැපෙන්නන්ගේ නඩත්තුව සඳහා පමණක් විය යුතුය.

(8) ආමුඛ ප්‍රේෂණ

පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් ඇමෙරිකානු ඩොලර් 50,000 හා ඊට වඩා වැඩි වන ආමුඛ ප්‍රේෂණයන් ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කිරීමේදී විනිමය පාලන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමේ අවශ්‍යතාවය ඉවත් කරන ලදී.

(අ) අත්තිකාරම් ගෙවීම් හෝ අපනයන සඳහා වන ගෙවීම් ;

(ආ) නැව් සඳහා ගෙවීම් සිදුකිරීමට පිටරට නියෝජිතවරුන් විසින් කරනු ලබන ගෙවීම් ;

(ඇ) නැව් හා ගුවන්යානා සඳහා තෙල් සැපයීම් ගාස්තු ගෙවීම සඳහා පිටරට නියෝජිතයින් විසින් කරනු ලබන ගෙවීම් ;

(ඈ) ශ්‍රී ලංකා නැව් වෙනුවෙන් පිටරට සිට එවනු ලබන ගැල් කුලී ;

(ඉ) විදේශීය ගුවන් සේවාවන් විසින් මෙහෙයවනු ලබන ශ්‍රී ලංකාවේ සිටින සාමාන්‍ය අලෙවි නියෝජිතයින් හා දේශීය ශාඛා කාර්යාල සඳහා ලැබෙන ප්‍රේෂණයන්.

(ඊ) එක්සත් ජාතීන්ගේ නියෝජිත කාර්යාල වෙත ලැබෙන අරමුදල්, එනම් : එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ පිළිවෙල, එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර ළමා ආපදා මුදල, ආහාර සහ කෘෂිකර්ම සංවිධානය, ලෝක සෞඛ්‍ය සංවිධානය හා කොළඹ ක්‍රම කාර්යාලය.

**රාජ්‍ය ණය**

මුදල් නීති පනතේ 113 වන වගන්තිය ප්‍රකාර රජය වෙනුවෙන්, රාජ්‍ය ණය පරිපාලනය තවදුරටත් මහ බැංකුව විසින් කරගෙන යන ලදී. රුපියල් ණය ආරම්භ කිරීම, විදේශ ණය ගෙවීම් පිළිබඳ වාර්තා පවත්වාගෙන යාම, දේශීය හා විදේශීය ණය ආපසු ගෙවීම, පොළී හා බැඳීම් ගාස්තු ගෙවීම් යනාදිය පැවරී ඇති ප්‍රධාන කාර්ය භාරයන් විය. 1982 අංක 40 දරණ ණය (විශේෂ විධිවිධාන) පනත සහ 1983 අංක 15 දරණ විසර්ජන පනත යටතේ, 1983 වර්ෂය තුළදී, රුපියල් දශ ලක්ෂ 8,188 ක් සඳහා වූ රුපියල් ණය ආරම්භ කෙරුනි. වර්ෂය තුළදී නිකුත් කරන ලද භාණ්ඩාගාර බිල්පත්, නොපියවූ ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 80 කින් ඉහළ යාමට හේතු විය. රාජ්‍ය ණය අධිකාරී විසින් වර්ෂය තුළදී, ඒකාබද්ධ ආයෝජන අරමුදල, බද්ධ සංචිත සහතික පත්, විදේශ පරිපාලන ණය ගැනීම සහ විදේශ ණය පිළිබඳව පරිපාලනය, තවදුරටත් කරගෙන යන ලදී. 1984 මුදල් වර්ෂයේ සිට බලපැවැත්වෙන පරිදි, රුපියල් ණය නිදහස් කර ගැනීම සඳහා නිදන් අරමුදල්වලට දායක මුදල් ගෙවීම අත්හිටවීම සලසනු පිණිස ලියාපදිංචි කළ ස්කන්ධ හා සුරකුම්පත් ආඥා පනත (පරි. 420), 1983 අංක 51 දරන පනත මගින් සංශෝධනය කරනු ලැබීය.

1983 වර්ෂයේ පොළී ගෙවීම්වල මුළු එකතුව රුපියල් දශ ලක්ෂ 6,593 ක් වූ අතර, නිදන් අරමුදල්වලට කරන ලද දායක දීමනා ද ඇතුළුව, ණය ආපසු ගෙවීම්වල මුළු ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 4,871 ක් විය.

මීට අමතරව, රාජ්‍ය ණය අධිකාරී විසින් නාගරික සංවර්ධන අධිකාරිය සහ රාජ්‍ය උකස් සහ ආයෝජන බැංකුව වෙනුවෙන් ණයකර ආරම්භ කරන ලදී.

**සේවක අර්ථසාධක අරමුදල**

දයක මුදල්, අධිභාර මුදල් හා අරමුදලේ මුදල් ආයෝජනය කිරීමෙන් ලබන ආදයම් ලබා ගැනීම, අරමුදලේ ලියාපදිංචි සේවා හා කේවල සාමාජික ගිණුම් ක්‍රමානුකූල ලෙස පවත්වා-ගෙන යාම සහ සාමාජිකයින්ගේ ප්‍රතිලාභ මුදල් ආපසු ගෙවීමේ වගකීම සේවක අර්ථසාධක අරමුදල් පනතේ විධිවිධාන ප්‍රකාර ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් දරනු ලබයි. පනතේ විධිවිධාන පරිපාලනය සහ ක්‍රියාත්මක කිරීමේ කටයුතුවල වගකීම දරනු ලබන කම්කරු දෙපාර්තමේන්තුවේ සේවක අර්ථසාධක අරමුදල් අංශය සමග බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව කිට්ටු සහයෝගීතාවයකින් ක්‍රියා කරනු ලැබේ. 1983 වර්ෂය තුළ එහි මෙහෙයවුම් කටයුතු පිළිබඳ සංක්ෂිප්ත සටහනක් පහත දක්වා ඇත.

**දයක මුදල්**

1983 වර්ෂය තුළදී අරමුදලට ලැබුණු දයක දීමනා ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 1,201.7 ක් වූ අතර, 1982 වර්ෂයේ එය, රුපියල් දශ ලක්ෂ 1,079.6 ක් විය. මෙය, කලින් වර්ෂය තුළ ලැබුණු දයක දීමනා මට්ටමට වඩා සියයට 11 ක වැඩි වීමකි.

**සාමාජිකයින්ගේ ශේෂ**

සමාලෝචනයට අදළ වර්ෂයට පොළී වෙන් කිරීමට පෙර, 1983 දෙසැම්බර් 31 වැනි දිනට සාමාජිකයින්ගේ ශේෂයන් රුපියල් දශ ලක්ෂ 8,341.9 ක්ව පැවැති අතර, එය 1982 වර්ෂයේ මට්ටමට වඩා රුපියල් දශ ලක්ෂ 1,501.6 ක නැතහොත් සියයට 22 ක වැඩි වීමකි.

**ආයෝජන**

මෙම අරමුදල විසින්, සමාලෝචන වර්ෂය තුළදී රජයේ සුරකුම්පත්වල සහ භාණ්ඩාගාර බිල්පත්වල රුපියල් දශ ලක්ෂ 2,389 ක මුදලක් ආයෝජනය කරන ලද අතර, එය 1982 වර්ෂයේදී රුපියල් දශ ලක්ෂ 1,477.7 ක් විය. මෙය 1982 වර්ෂයට වඩා සියයට 62 ක වැඩි වීමකි. සමා-ලෝචනයට භාජනය වූ වර්ෂය තුළ කරනු ලැබූ මුළු ආයෝජන ප්‍රමාණයට, කලින් කරනු ලැබූ ආයෝජන හා භාණ්ඩාගාර බිල්පත්වල කල්පිරුණු ප්‍රේෂණ ඵලයන් නියෝජනය කෙරෙන රුපියල් දශ ලක්ෂ 676.6 ක මුදලක් ද ඇතුළත් විය. රජයේ සුරකුම්පත්වල පමණක් ආයෝජ-නය කරනු ලැබූ මුදල රුපියල් දශ ලක්ෂ 2,345 ක් විය. මෙය, ශ්‍රී ලංකාණ්ඩුව විසින් 1983 වර්ෂයේ නිකුත් කරනු ලැබූ මුළු සුරකුම්පත් ප්‍රමාණයෙන් සියයට 26 ක මුදලක් නියෝජනය කෙරේ. 1983 දෙසැම්බර් 31 වැනි දිනට අරමුදල විසින් කර තිබූ මුළු ආයෝජන ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 8,956.7 ක්ව පැවතින. මෙය 1982 වර්ෂයේ මට්ටමට වඩා රුපියල් දශ ලක්ෂ 1,712.4 ක වැඩි වීමකි.

**ආයෝජනයන්ගෙන් ලැබූ ආදයම**

1983 වර්ෂයේදී අරමුදලේ ආයෝජනයන්ගෙන් ලැබූ ආදයම රුපියල් දශ ලක්ෂ 923.4 ක් වූ අතර, 1982 වර්ෂයේ එය රුපියල් දශ ලක්ෂ 658.5 ක් විය. මෙය සියයට 40 ක වැඩි වීමකි. මෙම වැඩි වීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ, අරමුදල වෙත ලැබුණු දයක මුදල් ප්‍රමාණයේ වැඩි වීම සහ සමාලෝචන වර්ෂය තුළදී, කලින් ආයෝජන වලින් ලැබුණු ආදයම නැවත ආයෝජනය කිරීම ද වේ.

**ප්‍රතිලාභ ගෙවීම්**

1983 වර්ෂයේදී සාමාජිකයින්ට, සේ. අ. අ. ප්‍රතිලාභ වශයෙන් ආපසු ගෙවන ලද මුදල රුපියල් දශ ලක්ෂ 383.6 ක් වූ අතර, 1982 වර්ෂයේ එය රුපියල් දශ ලක්ෂ 372.6 ක් විය. මෙය සියයට 3 ක වර්ධනයක් පෙන්නුම් කරයි. සමාලෝචිත වර්ෂය තුළ ප්‍රතිලාභ ආපසු ලබා ගැනීම සඳහා ලැබුණු හිමිකම්පෑම් සංඛ්‍යාව 75,049 ක් වූ අතර, මෙයින් 14,943 ක් ඉන්දියානු සම්භවය ඇති පෙරළා සිය රට යන්නවුන්ගෙන් සහ 31,085 ක ප්‍රමාණයක් වෛද්‍ය හේතු මත වූ ඉල්ලීම් විය. වර්ෂය තුළදී ආපසු ගෙවනු ලැබූ හිමිකම්පෑම් සංඛ්‍යාව 55,082 ක් විය.

**සාමාජිකයින්ගේ ශේෂයන් මත පොළිය**

සේවක අර්ථසාධක අරමුදල, සෑම වර්ෂයකම අවසානයේ ඇති ශේෂයන් මත, අරමුදලේ ආයෝජනවලින් ලැබෙන ආදායමෙන් පොළී ගෙවිය යුතු වේ. 1981 වර්ෂය අවසානයේ පැවති සාමාජිකයින්ගේ ශේෂයන් මත ගෙවිය යුතු පොළී අනුපාතිකය වර්ෂයකට සියයට 9.5 ක් වූ අතර, 1982 අගසිට ක්‍රියාත්මක වන පරිදි 1983 වර්ෂයේදී එය සියයට 10.0 දක්වා වැඩි කෙරිණ. වර්ෂය අවසානයේ සාමාජිකයින්ගේ බැරට ඇති ශේෂයන් මත පොළිය ගෙවනු ලබන අතර, ඊට පසුව එක්වන මුළු මුදලටද පොළිය රාශිකෘත වේ. එසේම, වර්තන වර්ෂයේ දායක දීමනාව නියෝජනය කෙරෙන කිසියම් කොටසක් සාමාජිකයාගේ බැරට ලැබුණු දිනය සැලකිල්ලට නොගෙන, වර්ෂය අවසානයේ සාමාජිකයාගේ බැරට පවතින ශේෂය මත මුළු අවුරුද්දටම පොළිය ගෙවනු ලැබේ. උදාහරණයක් වශයෙන් ජනවාරි මාසයේ ලැබුණු දායක දීමනා වලට ගෙවනු ලබන පරිදිම එම වර්ෂයේ දෙසැම්බර් මාසයේ දී ලැබෙන දායක මුදල් වෙනුවෙන්ද, සම්පූර්ණ වර්ෂය සඳහාම පොළිය ගෙවනු ලැබේ. එබැවින්, ක්‍රියාත්මක වන පොළී අනුපාතිකය සියයට 11.2 කට ආසන්න වේ.

අරමුදලේ මෙහෙයවුම් පිළිබඳව දැනට ඇති දත්තයන් මත සැකසුණු සංසන්දනාත්මක ප්‍රකාශනයක් පහත දක්වා ඇත.

**2 . 11 සංඛ්‍යා සටහන**

**සේ. අ. අ. සංඛ්‍යාන, 1982—1983**

රුපියල් දහස්

| | | 1982 | 1983 |
|---|---|---|---|
| 1. | ලැබුණු දායක දීමනා (රු.) .. | 1,079,584(අ) | 1,201,670(අ) |
| 2. | ආයෝජන (රු.) .. | 1,477,718(ආ) | 2,389,003(ආ) |
| 3. | ආයෝජන වලින් ලද ආදායම් (රු.) .. | 658,488 | 923,397 |
| 4. | ප්‍රතිලාභ ආපසු ගෙවීම් (රු.) .. | 372,643 | 383,644 |
| 5. | ආපසු ගෙවීම් සංඛ්‍යාව .. | 69 | 55 |
| 6. | පොළී අනුපාතිකය (%) .. | 10·0 | 12·0 |
| 7. | සාමාජික ශේෂයන් මත පොළී ප්‍රතිපාදන (රු.) .. | 684,034 | 1,001,027 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) අවිනිශ්චිත ගිණුමට බැර කළ දායක මුදල් හැර.

(ආ) කල්පිරුණු ප්‍රේෂණ ඵලයන්, රජයේ සුරැකුම්පත්වල ප්‍රති ආයෝජනයන් හා භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජන මුදල් ද ඇතුළුව.

UNIVERSITY OF MORATUWA LIBRARY SRI LANKA

## කාර්ය මණ්ඩල පුවත්

1983 වර්ෂය තුළදී අධිපති, ආචාර්ය ඩබ්ලිව්. රාසපුත්‍ර පහත සඳහන් සමුළු හා රැස්වීම්වලට සහභාගි විය.

(අ) ඉන්දුනීසියාවේ බාලිහි පවත්වන ලද අග්නිදිග ආසියානු (සීයසන්) මහ බැංකු අධිපති වරුන්ගේ සම්මන්ත්‍රණය (ජනවාරි 25–30)

(ආ) ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සංවර්ධන කමිටු රැස්වීම හා ලෝක බැංකුවේ වොෂින්ටන් හි පවත්වන ලද 24 කණ්ඩායමේ රැස්වීම් (අප්‍රේල් 20–මැයි 7)

(ඇ) එංගලන්ත බැංකුවේ පවත්වන ලද පොදු රාජ්‍ය මණ්ඩලීය මහ බැංකු අධිපති වරුන්ගේ සමුළුව, පැරිසියේදී පැවැත්වුණු ආධාර දීමේ කණ්ඩායමේ රැස්වීම හා නයිස් හිදී පැවැත්වුණු බැංකු කරුවන්ගේ සාමූහික රැස්වීම (ජුනි 8–19)

(ඈ) ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ හා ලෝක බැංකුවේ වාර්ෂික රැස්වීම් හා වොෂිංටන්හි පවත්වන ලද 24 කණ්ඩායමේ රැස්වීම (සැප්තැම්බර් 18–ඔක්තෝබර් 2)

(ඉ) නේපාලයේ කත්මන්ඩු හි පවත්වන ලද 15 වැනි සියැන්සා අධිපති වරුන්ගේ රැස්වීම (නොවැම්බර් 27–දෙසැම්බර් 5)

1983 ජනවාරි මාසයේ අධිපති දිවයිනෙන් බැහැරව සිටි කාලය තුළදී ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති, ආචාර්ය එච්. එන්. එස්. කරුණාතිලක බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරියා හා මුදල් මණ්ඩලයේ සභාපති වශයෙන් කටයුතු කළේය.

1983 අප්‍රේල්, ජුනි, සැප්තැම්බර්, ඔක්තෝබර්, නොවැම්බර් සහ දෙසැම්බර් යන මාසවල අධිපති දිවයිනෙන් බැහැරව සිටි කාලසීමා තුළ දී නියෝජ්‍ය අධිපති ඩී. එල්. කන්නන්ගර මහතා බැංකුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති වශයෙන් නම් කරනු ලැබ ප්‍රධාන විධායක නිලධාරියා හා මුදල් මණ්ඩලයේ සභාපති වශයෙන් කටයුතු කළේය.

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ලේකම් නොමැති කාලසීමාවන් තුළදී භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් සී. පී. වන්මුගම් මහතා මුදල් මණ්ඩලයේ විකල්ප නිල සාමාජිකයා වශයෙන් කටයුතු කළේය.

**පත්කිරීම්**

ඕමාන් මහ බැංකුවේ තනතුරක් සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට මුදා හරිනු ලැබ සිටි ආචාර්ය කේ. එස්. ඊ. ජයතිලක 1983 සැප්තැම්බර් 19 වැනි දින සිට නැවත බැංකු සේවාවට පැමිණි අතර විධායක අධ්‍යක්ෂ වරයෙකු වශයෙන් වැඩ භාර ගත්තේය.

ගැම්බියා මහ බැංකුවේ තනතුරක් සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට මුදා හරිනු ලැබ සිටි යූ. ඒ. ද සිල්වා මහතා 1983 ජුනි 06 වැනි දින සිට ආපසු බැංකු සේවාවට පැමිණි අතර ප්‍රධාන ගණකාධිකාරි වශයෙන් පත් කරන ලදී.

සේවක අර්ථ සාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ වැඩ බලන අතිරේක අධිකාරි, සී. සෙල්ව-සිරන්ජීවි මහතා පිළිවෙලින් 1983 අප්‍රේල් 01 වැනි දින හා ජුනි 11 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි කළමනාකාරිත්ව විගණන දෙපාර්තමේන්තුවේ වැඩ බලන අතිරේක අධ්‍යක්ෂ හා කළමනා-කාරිත්ව විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී.

සී. ඩී. විමලසූරිය මහතා 1983 සැප්තැම්බර් 09 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුවේ වැඩ බලන අධිකාරි වශයෙන් පත් කරන ලදී.

**විශ්‍රාම ගැනීම**

විධායක අධ්‍යක්ෂ එච්. ප්‍රේමරත්න මහතා 1983 අගෝස්තු 16 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි බැංකු සේවාවෙන් විශ්‍රාම ගත්තේය.

ජාතික සංවර්ධන බැංකුවට මුද හරිනු ලැබ සිටි වී. කේ. වික්‍රමසිංහ මහතා 1983 පෙබරවාරි 21 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි බැංකු සේවාවෙන් විශ්‍රාම ගත්තේය.

කළමනාකාරිත්ව විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ එම්. එච්. සවූජා මහතා 1983 ජූනි 11 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි බැංකු සේවාවෙන් විශ්‍රාම ගත්තේය.

ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුවේ අධිකාරී එස්. පී. වික්‍රමරත්න මහතා 1983 සැප්තැම්බර් 09 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි බැංකු සේවාවෙන් විශ්‍රාම ගත්තේය.

**මුදහරිනු ලැබ සිටි නිලධාරීහු (1983 දෙසැම්බර් 31 වැනි දිනට)**

පහත නම් සඳහන් බැංකු නිලධාරීහු පහත දැක්වෙන අමාත්‍යාංශ වලට, රජයේ දෙපාර්තමේන්තු වලට හා ශ්‍රී ලංකාවේ රාජ්‍ය සංස්ථාවලට සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ තනතුරු සඳහා ද මුද හරිනු ලැබ සිටියහ.

විධායක අධ්‍යක්ෂ ඒ. එස්. ජයවර්ධන මහතා බංගලාදේශය, භූටානය, ඉන්දියාව හා ශ්‍රී ලංකාව යන රටවල විකල්ප විධායක අධ්‍යක්ෂ වශයෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙත.

ආචාර්ය එස්. ටී. ජී. ප්‍රනාන්දු, මහජන බැංකුවේ සභාපති වශයෙන් කටයුතු කරනු සඳහා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වෙත.

එස්. රාජලිංගම් මහතා මහා භාණ්ඩාගාරයේ ආර්ථික කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ වශයෙන් කටයුතු කරනු සඳහා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වෙත.

එන්. ඒ. ධර්මබන්දු මහතා, සොළමන් දිවයින්වල මුදල් අධිකාරියේ තනතුරක් සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙත.

ආචාර්ය ඩබ්ලිව්. හෙට්ටිආරච්චි, භූටාන්හි රාජකීය මුදල් අධිකාරියේ තනතුරක් සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙත.

ටී. බාලසිංහම් මහතා සියරා ලියොන් බැංකුවේ තනතුරක් සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙත.

ආචාර්ය එම්. යූ. ඒ. තෙන්නකෝන්, අගැයීම් අධ්‍යයන පිළිබඳ උපදේශක වශයෙන් කටයුතු කරනු සඳහා ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත.

ඒ. ඒ. ඩී. ජස්ටින් මහතා, කර්මාන්ත හා විද්‍යා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම් වශයෙන් කටයුතු කරනු සඳහා කර්මාන්ත හා විද්‍යා කටයුතු පිළිබඳ අමාත්‍යාංශය වෙත.

ආචාර්ය ඒ. සී. රන්දෙනි, එම්. බී. දිසානායක, ජී. ඒ. වී. ෆොන්සේකා යන මහතුන් හා ආචාර්ය අයි. කුමාරස්වාමි මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වෙත.